

# දරිද්‍රතාවය හා ගැටුම් පිළිබඳ සාරාංශ සහිත ග්‍රන්ථ නාමාවලිය

සමන්ති ඇලපාත

මාර්තු 2008

අධ්‍යයන මාලාව අංක. 02

cepa
centre for poverty analysis

# දරිද්‍රතාවය හා ගැටුම් පිළිබඳ සාරාංශ සහිත ග්‍රන්ථ නාමාවලිය

සමන්ති ඇලපාත

මාර්තු 2008

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, කොළඹ

දරිද්‍රතාවය හා ගැටුම් පිළිබඳ සාරාංශ සහිත ග්‍රන්ථ නාමාවලිය

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2008

ප්‍රථම ප්‍රකාශනය 2008

ISBN : 978-955-1040-43-7

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

සංස්. සමන්ති ඇලපාත

දරිද්‍රතාවය හා ගැටුම් පිළිබඳ සාරාංශ සහිත ග්‍රන්ථ නාමාවලිය / සංස්. සමන්ති ඇලපාත - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2008, පිටු 60 කි. සෙ.මී. 21)

අධ්‍යයන මාලාව - අංක 02

ISBN : 978-955-1040-43-7 මිල රු. 350/=

i. 016.3625 ඩීඩීසී 21 ii. ඇලපාත, සමන්ති - සංස්

1. ග්‍රන්ථ නාමාවලි - දිළිඳුකම

පිටකවර නිර්මාණය : සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ

මුද්‍රණය : සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ
67, කාර්මික ජනපදය,
කටුවාන පාර,
හෝමාගම,
ශ්‍රී ලංකාව.

ප්‍රකාශනය : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශනමාලාවේ දැනට මතු දැක්වෙන ගණයන්හි ප්‍රකාශන ඇතුළත් වේ:
අධ්‍යයනයන්, සංස්කරණය කළ වෙළුම්, කාර්ය පත්‍රිකා සහ ලුහුඬින් කරුණු දැක්වීමේ පත්‍රිකා

# හැඳින්වීම

විවිධ සමාජ ගැටළු හා දරිද්‍රතාවය යන සංකල්පය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා මග පෙන්වීමක් වශයෙන් මෙම ග්‍රන්ථ නාමාවලිය සැකසී ඇත. මෙ මගින් ගැටළුවලින් බලපෑමට ලක් වූ කණ්ඩායම් දකින ආකාරයට ගැටළු හා දරිද්‍රතාවය අතර ඇති සම්බන්ධය විදහා දක්වන සම්පත් එක් තැනකට ගොනු කරයි. ඊට අමතරව ග්‍රාමීය හා නාගරික දිළින්දන් හා ආන්තික ජන කොටස් යන කණ්ඩායම් පිළිබඳව නොයෙක් සම්පත් මෙහි ගොනු කොට ඇත.

අන්තර්ජාතික හා දේශීය සන්දර්භයන් තුළ දරිද්‍රතාවය ඇති වීමට බලපාන හේතු හා එය තුරන් කිරීම තේමා කොටගත් ග්‍රන්ථ පළමු කොටස යටතේ පෙළ ගස්වා ඇත. දරිද්‍රතාවය ඇති වීමට බලපාන හේතු යටතේ නොයෙක් රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාවලීන් පිළිබඳව විචාරණය කරන කෘතීන් ද ඇතුල් වේ. දරිද්‍රතාවය තුරන් කිරීම යන්න හුදෙක් ආර්ථිකමය වශයෙන් සිදු කරනු ලබන සංවර්ධනය යන්නෙන් ඔබ්බට ගොස් අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් හා නිදහස වැනි සමාජීය හා මානසික කරුණු සාකච්ඡා කෙරෙන ග්‍රන්ථ හා ප්‍රකාශන ගොනු කොට ඇත.

දරිද්‍රතාවයෙන් හා ගැටුමෙන් පීඩාවට පත්වන ආන්තික ජන කොටස් යටතේ කාන්තාවන්, ළමුන්, අවතැන්වන ජනතාව, ආබාධිත පුද්ගලයන්, කම්කරුවන් හා වෘත්තිකයන් සැලකිල්ලට ගෙන ඇත. මෙම ආන්තික ජන කොටස් ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් පීඩා විඳින ආකාරය හා ඒ සඳහා හේතු වන නොයෙක් කරුණු මෙම කොටසේ අන්තර්ගත වන ප්‍රභවයන් විග්‍රහ කොට ඇත.

ගැටුම් නිරාකරණය, යුද්ධය හා සාමය ගොඩනැගීම හා තරුණ ගැටුම් යනුවෙන් තුන්වන හා අවසාන කොටසේ ග්‍රන්ථ හා ප්‍රකාශන පෙළ ගස්වා ඇත.

කොළඹ මහජන පුස්තකාලය, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සම්පත් කේන්ද්‍රය හා වෙනත් පුස්තකාල කිහිපයක් සතු ග්‍රන්ථ, ප්‍රකාශන හා වීඩියෝ පට මෙම ග්‍රන්ථාවලිය සැකසීමට උපයෝගී කොට ගැනිණි.

# පටුන


**1. දරිද්‍රතාවය**

1.1 අන්තර්ජාතික විවරණ 1
1.1.1 දරිද්‍රතාවය සඳහා බලපාන හේතු 1
1.1.2 දරිද්‍රතාවය තුරන් කිරීම 3

1.2 දේශීය විවරණ 5
1.1.1 දරිද්‍රතාවය සඳහා බලපාන හේතු 5
1.1.2 දරිද්‍රතාවය තුරන් කිරීම 7

**2. ආන්තික ජන කොටස්**

2.1 කාන්තාව 11
2.1.1 ගෘහස්ථ වශයෙන් පීඩාවට පත්වීම 11
2.1.2 රැකියා/ආදායම් උත්පාදන කටයුතුවලදී පීඩාවට පත්වීම 13
2.1.3 පුහුණු අත්පොත් - ස්ත්‍රී පුරුෂ සමාජභාවය 16
2.1.4 යුද්ධය/අරගල නිසා පීඩාවට පත්වීම 18

2.2 ළමුන් 20
2.2.1 යුද්ධය නිසා පීඩාවට පත්වීම 20
2.2.2 වරප්‍රසාද අහිමි වීම නිසා පීඩාවට පත්වීම 21
2.2.3 ළමයා සහ ප්‍රජා සංවර්ධන කටයුතු 23

2.3 අවතැන් වන ජනතාව 25
2.3.1 සංවර්ධන වැඩසටහන් නිසා අවතැන් වීම 25
2.3.2 යුද්ධය/අරගල නිසා අවතැන් වීම 26
2.3.3 ස්වභාවික ආපදා නිසා අවතැන් වීම් 33

2.4 ආබාධිත පුද්ගලයන් 35

2.5 සංස්කෘතිය/කුලය හෝ සමාජ වෙනස්කම් නිසා
පීඩාවට පත්වීම 36

2.6 කම්කරුවන්/වෘත්තිකයන් සහ ආදායම් උපයන්නන් 38

**3. ගැටුම්, ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම**

| | |
|---|---|
| 3.1 ගැටුම් නිරාකරණය | 42 |
| 3.1.1 පුහුණු අත්පොත් - ගැටුම් නිරාකරණය සහ ගැටුම් වාර්තාකරණය | 45 |
| 3.2 යුද්ධය සහ සාමය ගොඩනැගීම | 46 |
| 3.3 තරුණ ගැටුම් | 50 |
| 3.3.1 සමාජ/දේශපාලන කැරළි | 50 |
| 3.3.2 මත්ද්‍රව්‍ය භාවිතය සහ වැළැක්වීම | 52 |

# 1. දරිද්‍රතාවය

## 1.1 අන්තර්ජාතික විවරණ

### 1.1.1 දරද්‍රතාවය සඳහා බලපාන හේතු

1. ධනපාල, ඒ. එච්. 21 සියවසේ ගෝලීය අර්බුදඃ ජනගහනය, දිළිඳුකම සහ කුසගින්න. කොළඹ, එස්. ගොඩගේ. 2006. වැල්ලම්පිටිය, චතුර මුද්‍රණාලය. පිටු 231. ISBN 955-20-9328-7.

**අන්තර්ගතය**

ලොව පෙළෙන දිළිඳුකම, කුසගින්න හා සංවර්ධනය ආශ්‍රිත ගැටළු මෙම පොත මගින් සාකච්ඡා කර ඇත. පසු ගිය සියවස තුළ සංවර්ධනය අසාර්ථක වී, බලාපොරොත්තු ඉටු නොවී සංවර්ධනයේ නිමාවක් සිදු නොවූ අයුරු විමසිල්ලට ලක් කරයි.

අර්බුදකාරී ලෝකයඃ 21 වන සියවසේ පරිසරය සහ මිනිසා, දිළිඳුකම සහ සංවර්ධනය, කුසගින්න හා සාගතය හඳුනා ගැනීම, සංවර්ධනයේ ගෙවුණු අඩසියවස, දිළිඳුකම තාක්ෂණය සහ සංවර්ධනය, ලෝකය ජනාධිකද?, නගර හා නාගරික දිළිඳුකම, පරිසර හායනය හා තිරසර බව, ජාන ඉංජිනේරුකරණය සහ සංවර්ධනයඃ මිත්‍යාවන් හා හැකියාවන් සහ ප්‍රජාතන්ත්‍රකරණය, යහපාලනය සහ සංවර්ධනය යන මාතෘකා මෙම කෘතිය තුළින් විමසිල්ලට ලක් කර ඇත.

2. මාර්ග ආයතනය. දිළිඳු රටවල් සහ ධනවත් රටවල්. කොළඹ, මාර්ග ආයතනය. 1976. කොළඹ, ද ඩයමන්ඩ් ප්‍රින්ටර්ස්. පිටු 1 කොටස 189, 2 කොටස 114, 3 කොටස 168.

**අන්තර්ගතය**

දියුණු වෙමින් පවතින සහ දියුණු වුණු රටවල ආර්ථික තත්ත්වය අතර පවතින පරතරය දිනෙන් දින විශාල වන බව පැවසේ. දියුණු වුණු රටවල් ඉතාමත් ශීඝ්‍රයෙන් දියුණු වන අතර දියුණු වෙමින් පවතින රටවල් ඉතා සුළු වශයෙන් දියුණු වේ. එසේ නම්, මේ මන්දගාමී දියුණුවට හෙවත් නොදියුණු බවට හේතු කවරේද? එම නොදියුණු බව, එයට හේතු සහ විසඳුම් මාර්ග පිළිබඳ ආර්ථික විද්‍යාඥයින් ඉදිරිපත් කරන විශ්ලේෂණාත්මක ලිපි මෙම ග්‍රන්ථයට ඇතුළත් වේ.

3. මිර්ඩාල්, ගුනාර්. දිළිඳු බවේ අභියෝගය (ලෝකය දිළිඳු බවින් මුදවා ගැනීමේ වැඩසටහනක්). කොළඹ, මාර්ග ආයතනය. 1976. පිටු 1 කොටස 281, 2 කොටස 232

### අන්තර්ගතය

ලෝකයේ තුනෙන් දෙකකට වැඩි ජන සංඛ්‍යාවක් තවමත් දිළිඳු බවේ පත්ලේ ම රැඳී සිටියි. එහෙත් එම රටවල් දියුණු වෙමින් පවත්නා රටවල් යනුවෙන් හැඳින්වේ. ඒ අතර ම දියුණු වූ රටවල් හා දියුණු වෙමින් පවත්නා රටවල් අතර පරතරය තව තවත් වැඩෙන්නේ යැයි ද පැවසේ. මේ පරස්පර විරෝධී ප්‍රකාශනයන් දෙකත් ලෝකයේ පවත්නා දැඩි දිළිඳු බවත් පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයක් මිර්ඩාල් ඉදිරිපත් කර ඇත.

ලෝකයේ පවත්නා දැඩි දිළිඳු බව මුළු මහත් ලෝකයට ම අභියෝගයක් සපයන බව සැබෑ ය. ඉන් මිදීමට නොයෙක් උපක්‍රම, ප්‍රතිපත්ති හා වැඩසටහන් යොදවා ඇති නමුදු දිළිඳු බවේ වෙනසක් සිදු වී නැත. මේ සත්‍යයට පිටුපස ඇති හේතු ද මෙතෙක් ඉදිරිපත් කර ඇති පිළියම් පිළිබඳ ඉතා වැදගත් විග්‍රහයක් මෙම කෘති තුළින් ඉදිරිපත් කර ඇත. එම විග්‍රහය අප රටේ ප්‍රශ්න ගැන උනන්දුවක් දක්වන සියළුම දෙනාට වැදගත් වනු ඇත.

4. රත්නායක, එම්. මානව සම්පත් සහ ජනාවාස. කතෘ. 1999. මහරගම, තරංජි ප්‍රින්ට්ස්. පිටු 152. ISBN 955-96083-1-2.

### අන්තර්ගතය

වර්තමානය වන විට ලෝකයේ ජනගහනය මිලියන 6000 ඉක්මවා වර්ධනය වී ඇත. එය වාර්ෂිකව මිලියන 86කින් පමණ වර්ධනය වෙමින් පවතියි. අද පවතින ජන සංඛ්‍යාව පවා හොඳින් පෝෂණය කිරීමට පවා ලෝකයට හැකියාවක් නොමැත. එයට අමතරව ලොව පුරා විවිධාකාර අර්බුද උද්ගත වී ඇත. එම අර්බුද කෙරෙහි ජන සංඛ්‍යාව ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන බව නොරහසකි. මෙබඳු තත්ත්වයන් යටතේ ජන සංඛ්‍යාව හා ඔවුන්ගේ වාසස්ථාන වන ජනාවාස පිළිබඳව විමසා බැලිය යුතු ය. මෙම කෘතිය තුළින් වතු ජනාවාස, ග්‍රාමීය ජනාවාස, නාගරික ජනාවාස සහ නාගරීකරණය ආශ්‍රිත ගැටළු පිළිබඳ විමසීමක් සිදු කර ඇත.

5. ලක්ෂ්මන්, ඩබ්. ඩී. නිර්බාධිකරණය හැඳින්වීමක්. කොළඹ. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය (SSA). 1998. හෝමාගම, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 208. ISBN 955-9102-24-9.

අන්තර්ගතය

අමිත් භදුරි සහ දීපක් නයාර් යන ඉන්දියානු කතුවරුන් විසින් රචිත The Intelligent Person Guide to Liberalization නම් කෘතියේ සිංහල පරිවර්තනයයි. මෙම කෘතිය ඉන්දියාව පිළිබඳ වුව ද එහි ලා විමර්ශනයට ලක් කෙරෙන ප්‍රතිපත්ති මාලාව ශ්‍රී ලංකාව තුළ ද විවිධ තීව්‍රතාවෙන් යුතුව 1977 සිට කාලය තුළ අනුගමනය වෙමින් තිබේ.

1990 ගණන්වල මුල ඉන්දියාව මුහුණපා සිටි බරපතල විදේශීය විනිමය අර්බුදයත් එහි අලුතෙන් තේරී පත් වුණු ආණ්ඩුව නිර්බාධිකරණය පිළිබඳ පක්ෂපාතී දේශපාලන ආකල්ප දැරීමත් හේතු කොට ගෙන ඉන්දියාව ද 1991 දී නිර්බාධිකරණ පැකේජයක් පිළිගෙන ක්‍රියාත්මක කළේ ය. එම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයට ප්‍රතිචාර වශයෙන් ඉන්දියාව තුළ පුළුල් විවාදයක් පැන නැගිණි. එම විවාදය තුළ අනුගමනය කරන ලද නිර්බාධිකරණ පැකේජයේ තෝරා ගත් අංග ලක්ෂණ සමහරක් විචාරාත්මක විමර්ශනයකට ලක් කරන කෘතියක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

6. විතාරණ, පියසේන. සංවර්ධන සංවාද. දෙහිවල. තිරසර. 2000. කොළඹ, රිචි ග්‍රැෆික්, පිටු 260. ISBN 955-97079-0-6.

අන්තර්ගතය

සංවර්ධනය පුළුල් ලෙස සාකච්ඡා කරන කාලීන තේමාවකි. එහි විෂය පථය විවිධ කරුණු ගණනාවක් ඔස්සේ දිව යයි. ඒ එක් එක් මාතෘකා පිළිබඳ හදාරා සමෝධානික දැනුමක් ලබා ගැනීම යුගයේ අවශ්‍යතාවය කි. මෙම කෘතිය තුළින් සංවර්ධනයේ විවිධ අංශ පිළිබඳ සාකච්ඡා කර ඇත. කාලීන ලෝක සංවර්ධනය හා එහි ගැටළුවල යථාර්ථය සාකච්ඡා කිරීම මෙම කෘතිය තුළින් සිදු කරනු ලබයි.

### 1.1.2 දරිද්‍රතාවය තුරන් කිරීම

7. ගාවින්, කරුණාරත්න. සුළු පරිමාණ ව්‍යාපාර (තුන් වැනි ලෝකයේ දිළිඳුකම නැති කිරීමට හා රැකියා සාධනයට ක්‍රියාදාමයක්: ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ග්‍රීව ග්‍රහණයෙන් මිදීමට එකම මාර්ගය). නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ. 1999. පොල්ගස්ඕවිට, සිකුරු ප්‍රකාශකයෝ. පිටු 81. ISBN 955-573-079-2.

## අන්තර්ගතය

ලෝක බැංකුව විසින් තුන් වැනි ලෝකයේ රජයන්ට පවරා ඇති සංස්ථාන සකස් කිරීමේ වැඩ පිළිවෙල නිසා තුන් වැනි ලෝකයට සිදු වී ඇති විනාශය සමාලෝචනය කරන මෙම ග්‍රන්ථය, සුළු පරිමාණ ව්‍යාපාර ක්‍රමවත් පරිදි දියුණු කිරීමෙන් සංවර්ධනය කරා පා නැගිය හැකි බව දක්වයි. විදේශ විනිමය සොයා නිතිපතා ආධාර සොයන තුන් වැනි ලෝකයේ රජයන්ට ආධාර පතා යාම නවතා සංවර්ධනය කරා පා නැගිය හැකි මාධ්‍යයක් පැහැදිළි කර ඇත.

සුළු පරිමාණ ව්‍යාපාර තුන් වැනි ලෝකයේ රැකියා නිපැයීමටත් දිළිඳු බව නැති කිරීමටත් ඇති විශේෂ ක්‍රියාදාමයකි. සුළු පරිමාණ ව්‍යාපාර වර්ධනය, තුන් වැනි ලෝකයේ ආර්ථික තත්ත්වය විශේෂයෙන් ම එම ආර්ථික දැනුම අනුගමනය හා ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් අනුව ක්‍රියාත්මක වන සංස්ථාන සකස් කිරීමේ වැඩ පිළිවෙළ හා සම්බන්ධ කිරීම මැනවි යයි සිතේ. මෙම විමර්ශනයේ අග කොටසේ සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය මූලධර්ම හා කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර සම්පත් හා කර්මාන්ත සංවර්ධනය ඇති කළ හැකි අයුරු දැක්වේ. 8. සාර්ක් ලේකම් කාර්යාලය (SARC) සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS). දිළිඳුකම පිටුදැකීම පිළිබඳ ස්වාධීන දකුණු ආසියාතික කොමිෂන් සභාවේ වාර්තාව (අපේ අනාගතය-අපේ වගකීමයි. දරිද්‍රතාවයෙන් මුක්ත දකුණු ආසියාවක් කරා ගමන් මග). කොළඹ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය. 2004. කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 151. ISBN 955-8708-26-7.

## අන්තර්ගතය

දිළිඳුකම පිටුදැකීම සම්බන්ධයෙන් සාර්ක් රටවල් 07 හි පවත්නා විවිධ අත්දැකීම් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් කර 'ඩකා' නගරයේ පැවැත්වෙන හත් වැනි සාර්ක් සමුළුවට වාර්තා කිරීමට සහ දරිද්‍රතාව පිළිබඳ ස්වාධීන දකුණු ආසියානු කොමිසමක් පිහිටුවීමට 1991 වසරේ කොළඹ පැවැති සාර්ක් සමුළුවේ දී තීරණය විය. එම කොමිෂන් සභාව තම අධ්‍යයන වාර්තාව මගින් ආර්ථික සංවර්ධනය, මානව සංවර්ධනය හා සාධාරණත්වය යන ක්ෂේත්‍රයන් සම්බන්ධ වූ සමස්ත ජාතික ප්‍රයත්නයෙහි ලා ආර්ථිකමය සහ සමාජමය පරිවර්තනයක් සිදු කළ හැකි ක්‍රියාකාරී සාධකයක් වශයෙන් දිළිඳු ජනතාවගේ කාර්යභාරය ඉතා වැදගත් වන බව දක්වා ඇත. දරිද්‍රතාව පිටුදැකීමට හැකි වන අයුරින් දිළිඳු ජන කොටස් බලගැන්වීමේ ඵලදායී ක්‍රමෝපායන් ලෙස එය දක්වා ඇත. මෙම ලේඛනයෙ හි වාර්තා කර ඇති ප්‍රශස්ත පරිචයන්

හරහා ඒ ඒ රටවලට ආවේණික සාර්ථකත්වය පිළිබඳ තෝරා ගත හැකි කථා පුවත් රැසක් ඉදිරිපත් කෙරේ.

9. ඩිග්බි, මාගරට්. ලෝක සමූපාකාර ව්‍යාපාරය. කොළඹ, එම්. ඩී. ගුණසේන සහ සමාගම. 1967. පිටු 201.

### අන්තර්ගතය

ධනවාදී ආර්ථික ක්‍රමය සහ පෞද්ගලික ව්‍යාපාර ක්‍රමයෙ හි විශේෂාංගයක් ලෙස ඇතමෙක් සමූපාකරය හඳුන්වති. තවත් බොහෝ අය එය සමාජවාදයේ කොටසක් හෝ අංග සම්පූර්ණ සමාජවාදී සමාජයක පූර්ව අවස්ථාව ලෙස හඳුන්වති. තවත් බොහෝ අය තුළ සමූපාකාර ව්‍යාපාරය පිළිබඳ විවිධ අදහස් පවතියි. මෙම අදහස්වලින් වඩාත් නිවැරදි ම අදහස කුමක්ද? යන්න තීරණය කළ හැක්කේ ව්‍යාපාරයේ ඉතිහාසය, එයට සම්බන්ධ අය, බොහෝ රටවල ව්‍යාප්ත වී ඇති එහි විවිධ අංග පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමෙන් පමණි. සමූපාකාර ව්‍යාපාරය පිළිබඳ මෙවැනි දැනුමක් ලබා ගැනීමෙන් පසු වෙනත් ආර්ථික ක්‍රම හා සැසඳෙන කල සමූපාකාරයට ලැබී ඇති නියම වැදගත්කම කුමක්ද? අනාගතයේ දී එයට ලැබිය හැකි තත්ත්වය කුමක්ද? යනාදිය පිළිබඳව මෙම කෘතිය තුළින් අවබෝධයක් ලබා ගත හැක.

## 1. 2 දේශීය විවරණ

### 1.2.1 දරිද්‍රතාවය සඳහා බලපාන හේතු

10. කොරයා, ගාමිණී. මෙරට දිළින්දන්ගේ අනාගතය, කොළඹ, සී/ස ස්ටාර් මුද්‍රණාලය. 1986. පිටු 26.

### අන්තර්ගතය

(ආචාර්ය එන්. එම්. පෙරේරා අනුස්මරණ සිව්වැනි දේශනය, කුලරත්න අනුස්මරණ ශාලාව, ආනන්ද මහ විදුහල, කොළඹ 10, 1986 අගෝස්තු 2)

පවතින ජාතික ආදායම කෙතරම් ද යත්, එය සමාන ලෙස බෙදනු ලැබුව ද?, අප ජනතාව සාපේක්ෂ අන්දමින් දුප්පත් ලෙස සිටින නිසා, හුදෙක් ආදායම් බෙදී යන්නේ කෙසේද? යන මාතෘකාවට සීමා නොවී එහි සීමාවන් අතිශයින් පුළුල් බව මෙම දේශනයෙන් විග්‍රහ කරනු ලබයි. හුදෙක් අනාථයන් නොව දුප්පතුන්, අප ජනගහනයේ අති විශාල වැඩි කොටස වෙයි. ඔවුන්ගේ අනාගතය අප ආර්ථිකයේ අනාගතය හා කිට්ටුවෙන් බැඳී සිටියි. ඒ අතර ආර්ථිකයේ අනාගතය අභ්‍යන්තරික වශයෙන් අප අනුගමනය කරන ප්‍රතිපත්ති සහ

අපට ක්‍රියා කිරීමට සිදු වී තිබෙන බාහිර පරිසරයත් අතර වූ ගැටීම්වලින් තීරණය කරනු ලැබේ. අප රටේ දුප්පතුන්ගේ අනාගතය කරුණු 02ක් මත රඳා පවතියි. ඉදිරි කාලයේ දී අප ආර්ථිකය වර්ධනය වේ යැයි බලාපොරොත්තු විය හැකි අන්දම ඉන් එකකි. එම වර්ධනයෙන් ඇති වන්නා වූ ලාභ ප්‍රයෝජන රටේ නොයෙකුත් ආදායම් කොටස් අතර බෙදී යන අන්දම දෙවැන්න ය. මෙම කරුණු දෙක පිළිබඳව පාඨකයාගේ කල්පනාව යොමු කිරීමට මෙම පොත (දේශනය) තුළින් අදහස් කර ඇත.

11. රිචර්ඩ්ස්, ජේ. පීටර් සහ ගුණරත්න, විල්බට්. ශ්‍රී ලංකාවේ මූලික අවශ්‍යතා, දිළිඳුකම සහ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනය. කොළඹ, ශ්‍රී ලංකා පදනම් ආයතනය (SLFI). 1981. පිටු 156.

**අන්තර්ගතය**

(ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අධ්‍යයනයකි (ILO).

මෙම අධ්‍යයනය සිදු කර ඇත්තේ ලෝක රැකියා නියුක්ත සමුළුවේ (WEP) ආදායම් ව්‍යාප්ති හා රැකියා නියුක්ති වැඩසටහනේ රාමුව ඇතුළත ය. මෙම වැඩසටහන ඇතුළත ලෝකයේ විවිධ ප්‍රදේශවල අධ්‍යයන ගණනාවක් සිදු කර ඇත. ආදායම් ව්‍යාප්තිය හා රැකියා නියුක්තිය අතර ඇති සම්බන්ධතාවය ගවේෂණය කිරීම ද මෙම අධ්‍යයනවල අරමුණ විය. මෙම වැඩසටහන රජයේ වැය සහ බදු අය කිරීම වැනි රාජ්‍ය ප්‍රතිව්‍යාප්ති ප්‍රතිපත්තියේ ක්‍රියාමාර්ගයන් පිළිබඳවත්, ධනයේ ව්‍යාප්තියේ සහ ප්‍රතිව්‍යාප්තියේ ක්ෂේත්‍රය පිළිබඳවත්, දිළිඳුකම හා මූලික අවශ්‍යතා සපුරා ගැනීම නම් ගැටළුව පිළිබඳවත් සැලකිල්ල දක්වා ඇත.

12. ගුණසේකර, සූරිය. සංවර්ධන ඇදහිල්ල. බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ. 1994. පිටු 112. ISBN 955-9170-01-5.

**අන්තර්ගතය**

අද ලොව පුරා සංවර්ධනය විසින් දරන ගෞරවනීය තත්ත්වය සහ එහි යථාර්ථය අතර ඇති අති විශාල වෙනස කරුණු සහිතව පැහැදිළි කිරීම මෙම කෘතිය මගින් සිදු කරනු ලබයි. පොදුවේ ලෝකයටත් විශේෂයෙන් ම නිවර්තනික රටවලටත් ඉන් සිදුවිය හැකි හානිය මෙහි අවධාරණය කර තිබේ. අප්‍රිකානු රටවලට සිදු වූ විනාශය හා හානිය ගෙන හැර දක්වන කතුවරයා අද හෙටම ලංකාවටත් එම ඉරණම අත් නොවේදැයි යන ප්‍රශ්නය පාඨකයා හමුවේ තබයි. එදා සංවර්ධනය අද දවසේ චිරස්ථායී සංවර්ධනය ලෙසට වෙනස් කර ගැනීමට හේතු භූත වූ එම අහිතකාරී පැත්ත අද

ලෝකය තේරුම් ගෙන ඇත. නමුත් ලංකාවේ උදවියට නම් තවමත් එය සංවර්ධන ඇදහිල්ලකි. නොහොත් සංවර්ධන දෙවියෙකි. හැකි පමණින් ඒ පිළිබඳ මෙරට සාමාන්‍ය ජනතාවට ඒත්තු ගැන්වීම මෙම කෘතියේ අරමුණයි.

### 1.2.2 දරිද්‍රතාවය තුරන් කිරීම

13. පෙරේරා, එන්. එච්. දිළිඳුකම පිටු දැකීම පිළිබඳ බෞද්ධ මතය. දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 2005. නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්. පිටු 62. ISBN 955-1222-48-2.

**අන්තර්ගතය**

දුප්පතුන් ලෙස සිටින පුද්ගලයන් කළ යුත්තේ උට්ඨාන වීර්යයෙන් නැගී සිටීමයි. බුදු දහමේ කිසිදු තැනක දිළින්දන් හට දියුණු වීමට නොහැකි යැයි උගන්වා නැති අතර දිළිඳුකම අභිවෘද්ධියට බාධාවක් යැයි ද නොකියයි. එහෙත් තනි තනි පුද්ගලයන් වශයෙන් දිළිඳුකම නැති කර ගැනීමට උත්සාහ දැරිය යුතු ය. ඊට අවශ්‍ය උපදෙස් බුදුදහම තුළින් නොඅඩුව ලැබේ. දිළිඳුකම පිටුදැකීමේ කාලීන අවශ්‍යතාවය සඳහා බුදු දහමට අනුව ත්‍රිපිටකය සහ අනෙකුත් පොත් පත් තුළින් උපුටාගත් කරුණු මෙම ග්‍රන්ථය තුළින් ඉදිරිපත් කර ඇත.

14. ධර්මසේන, එන්. දිළිඳුකම තුරන් කිරීම සඳහා සාක්ෂරතාවය හා නොවිධිමත් අධ්‍යාපනය. වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ. 2002. පිටු 163. ISBN 955-978-77-0-5.

**අන්තර්ගතය**

ප්‍රජා සංවර්ධනය සඳහා විධිමත් අධ්‍යාපනය මෙන් ම අවිධිමත් අධ්‍යාපනය ද එක සේ වැදගත් බව අද සැවොම පිළිගත් සත්‍යයකි. විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයට වඩා අවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැළසුම් සකස් කිරීම, නියාමනය හා ඇගයීම් වුව ද වෙනස් වන අතර, මෙහෙයවීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය ද විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයට වඩා වෙනස් වේ. මෙම නිබන්ධනයේ දී කතුවරයා අරමුණු කර ඇත්තේ අවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉහත කරුණු විකාශනය කිරීමටයි. එපමණක් නොවේ, ප්‍රගතිය පිළිබඳව සහ ගුණාත්මක බව පිළිබඳව ඇති දර්ශකයන්ගේ ද වෙනසක් විධිමත් හා අවිධිමත් අංශ දෙක අතර ඇත. එබැවින් මෙහි එන ඇතැම් කරුණු විධිමත් හා අවිධිමත් යන අංශ දෙකට ම එක විට ඒකාබද්ධව යොදා ගත හැකි නොවේ, අවිධිමත් අධ්‍යාපනය සඳහා පමණක් යොදා ගත හැකි ය. අවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යභාරය හඳුනා ගැනීමට මෙන් ම

ක්‍රියාත්මක කිරීමට ද එහි නියැලෙන්නන්ට මෙය ගුරු කොට ගත හැකි කෘතියකි. දිළිඳු ජනතාව වෙනුවෙන් යමක් කිරීම සඳහා සහ විශ්ව විද්‍යාලයේ මෙම ක්ෂේත්‍රය හදාරන අයටත් මෙම කෘතිය ප්‍රායෝගික ක්‍රියාවලියක් දියත් කරන්නේ කෙසේදැයි හඳුනා ගැනීමට ඉවහල් වේ.

15. විජේරාම, ලයනල්. ග්‍රාම සංවර්ධනය සහ සංවර්ධනය. කොළඹ, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය. 1998. කොළඹ, සිරින් එන්ටර්ප්‍රයිසස්. පිටු 175. ISBN 955-8225-00-2.

### අන්තර්ගතය

ග්‍රාම සංවර්ධනය, එසේ නැති නම් දිළිඳුකම තුරන් කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංවර්ධන කාර්යකි. රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවලින් මේ සඳහා විශාල දායකත්වයක් සපයනු ලබයි. එම සංවර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරීන් විශාල ප්‍රමාණයකගේ දායකත්වය ලැබුණ ද, එහි සාර්ථකත්වය රඳා පවතින්නේ එම ක්‍රියාකාරීන්ගේ නිර්මාණශීලිත්වය, කැපවීම, දැනුම සහ කුසලතා යන ගුණාංග මතයි. මෙම ගුණාංග එම ක්‍රියාකාරීන් තුළ අඩු වැඩි වශයෙන් තිබුණ ද ඒවා තව දුරටත් වර්ධනය කර ගැනීමේ අරමුණෙන් මෙම කෘතිය සම්පාදනය කර ඇත.

මෙම කෘතිය තුළ, ලංකාවේ ග්‍රාම සංවර්ධනය ඉතිහාසය හා විකාශය (ඒ. බී. තලගුණේ), ග්‍රාම සංවර්ධනය සහ සමාජ බලවේග (එස්. ටී. හෙට්ටිගේ), නිදහස් ශ්‍රී ලංකාවේ සහභාගිත්ව මග (සුසිල් සිරිවර්ධන), ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමට එක් වන සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාර (ඩබ්. පී. මිත්‍රරත්න), සංවර්ධනයෙහි ලා මානව විභව ශක්ති වර්ධනය (දයා රෝහණ අතුකෝරාළ), ග්‍රාම සංවර්ධනය උදා කිරීමේ උපකාරකයක් ලෙස ව්‍යාපෘති භාවිතය (ලලිතා එස්. ප්‍රනාන්දු), සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට ප්‍රජාවන් යොමු කිරීම සහ රාජ්‍ය අංශයෙහි වැඩසටහන් සම්පාදනයෙහි ලා ඒකාබද්ධ ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සංකල්ප (ආචාර්ය ගොඩ්ප්‍රි ගුණතිලක) සහ ශ්‍රී ලංකාවේ දිළිඳු බව, එහි ස්වභාවය හා දිළිඳු බව හීන කිරීමේ ක්‍රමෝපායන් (ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක) යන ලිපි අන්තර්ගත ය.

16. අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය (ITDG/ Practical Action). ප්‍රජා තාක්ෂණ දශකය. කොළඹ, අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය. 2000. කොළඹ, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්. පිටු 100. ISBN 955-9417-07-X.

## අන්තර්ගතය

දුප්පත්කම සහ සමාජ අසාධාරණය දුරලීමට යෝග්‍ය තාක්ෂණය භාවිතා කළ හැකි බව අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ විශ්වාසයයි. අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය ශ්‍රී ලංකාවේ ප්‍රජාවට යෝග්‍ය තාක්ෂණය පිළිබඳව මැදිහත් වන්නට පටන් ගෙන වසර 2000 දී වසර 10ක් සම්පූර්ණ විය.

ඒ නිමිත්තෙන් "තාක්ෂණයයි ප්‍රජාවයි දස වසරයි" මැයෙන් තරඟයක් පැවතුණි. ජීවිතයේ උදා වෙන ගැටළු විසඳා ගැනීම සඳහා යහපත් වෙනසක් ඇති කිරීමට තාක්ෂණික මැදිහත් වීමක් බලපාන ආකාරය පිළිබඳව ලියා එවිය හැකි වන සේ එම තරඟය පුළුල් පදනමක පිහිටා තිබුණි. මෙහි දී අප තාක්ෂණය ලෙස දකිනුයේ යන්ත්‍ර සූත්‍ර හෝ මෙවලම් පමණක් නොව එය ලිපක් තැනීම වැනි මූලික කටයුත්තක් හෝ කුඩා විදුලි බලාගාරයක් විය හැකි බව පැහැදිළි කර තිබුණි. එම තරඟයේ අවසාන වටයට තෝරාගත් යෝග්‍ය තාක්ෂණ දායකත්වය පිළිබඳ ලිපි 12 මෙම පොතට ඇතුළත් වේ.

17. රාජකරුණානායක, සුනේත්‍රා. පහන් මාර්ග. කොළඹ, අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය. 1999. කොළඹ, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්. පිටු 34. ISBN 955-9417-04-05.

## අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදුලි බල ප්‍රවාහයෙන් බලශක්තිය ලබා ගැනීමට නොහැකි ගම්මාන අප රටේ ඕනෑ තරම් ඇත. ප්‍රධාන ප්‍රවාහයට බොහෝ දුරින් එම ගම්මාන පිහිටා තිබීම එයට එක් හේතුවකි. ගමට හෝ නිවසට විදුලි බල පහසුකම් නොමැති වීම, එහි වැසියන් ආර්ථික සහ සමාජීය වශයෙන් දිළිඳු බවට පත් වීමට එක් හේතුවකි.

ප්‍රධාන ප්‍රවාහය පිළිබඳව පමණක් බලාපොරොත්තු නොතබා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර, සුළං බලශක්තිය, ජීව වායු බලශක්තිය වැනි වෙනත් විකල්ප බලශක්ති ප්‍රභවයන් ප්‍රජාවට හඳුන්වා දීම අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ බලශක්ති වැඩසටහන තුළින් සිදුකරනු ලබයි. එමගින්, අදාළ ප්‍රජාව පෙළෙන දරිද්‍රතාවයෙන් සහ සමාජ විෂමතාවයෙන් මුදවා ගැනීමට එක් මාර්ගයක් හෝ උදාකර ගත හැකිවනු ඇත.

විකල්ප බලශක්ති ප්‍රභවයන් තුළින් බලශක්ති ගැටළුව විසඳාගත් ප්‍රජාවන්ගේ කතාන්දර පහන් මාර්ග ග්‍රන්ථයට ඇතුළත් වී ඇත.

18. කුමාරසිරි, සිසිර. ජලය සෞඛ්‍යාරක්ෂාව හා ප්‍රජා සංවර්ධනය. කොළඹ, රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ජල හා සෞඛ්‍යාරක්ෂක දශක සේවාව. 1986. රත්මලාන, සර්වෝදය විශ්ව ලේඛා. පිටු 80.

### අන්තර්ගතය

ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රියාවලිය තුළ සෞඛ්‍ය තමන් විසින් උදා කර ගත යුතු ක්‍රියාවක් බව මෙම පොත තුළින් පැහැදිළි කර ඇත. ප්‍රජා සෞඛ්‍ය කටයුතු නංවාලීමෙහි නියුතු සෞඛ්‍ය සේවක සේවිකාවන්ට මෙය අත්පොතක් ලෙස භාවිතා කළ හැක. දිළිඳුකම, නූගත්කම වැනි හේතු නිසා සෞඛ්‍ය ගැටළුවලට මුහුණ දෙන ප්‍රජාව වෙත මෙම පොතේ උපදෙස් අනුව කරුණු පහදා දීම තුළින් ඔවුන් එම තත්ත්වයෙන් මුදවා ගැනීමට හැකි වනු ඇත.

19. ජනතා විමුක්ති පෙරමුණ (JVP). දේශය ගොඩනැංවීමේ ජාතික වැඩපිළිවෙලඃ බෙදීම වෙනුවට සමගිය - වහල්භාවය වෙනුවට නිදහස. කොළඹ, ජනතා විමුක්ති පෙරමුණ. 2003. කොළඹ, ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්. පිටු 77.

### අන්තර්ගතය

ශ්‍රී ලංකාව අද මුහුණ පා ඇත්තේ, එහි ඉතිහාසයේ වඩාත් ම භයානක වූ ද අවදානම් සහගත වූ ද ඉරණමකට ය. එය සමස්ත ශ්‍රී ලංකා සමාජය වෙළාගත් ගැඹුරු ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයේ ප්‍රතිඵලයයි. මේ වන විට අප දේශයට ශක්තිමත් ජාතික ආර්ථිකයක් ගොඩනැගීමේ මාවත අහිමි වී ඇති අතර ඒ වෙනුවට විජාතික ජාවාරම්කරුවන්ගේ වුවමනාවන් සපුරාලීම සඳහා පරාධීන ආර්ථිකයක් ගොඩනැගෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකාවේ නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදිතයෙ හි ප්‍රතිශතයක් ලෙස ගත් විට 105% ඉක්මවයි. එයින් පිළිබිඹු වන්නේ අප රට මුහුණ පා ඇති වර්තමාන ආර්ථික අර්බුදයේ ගැඹුරයි.

දිනෙන් දින වැඩෙන මේ පොදු අන්තරාය වැළැක්වීම මෙන් ම, රට මුහුණ දී ඇති මෙම ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ව්‍යසනයෙන් එය මුදා ගැනීමත්, රට ගොඩ නැගීම සඳහා යොමු වූ විකල්ප ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් පුළුල් ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත් එක සේ වැදගත් ය. ශ්‍රී ලංකාව මුහුණ දී ඇති මෙම බහුවිධ විනාශයෙන් එය මුදවා ගැනීමත්, යළි ගොඩනැංවීමත් සිදු කළ හැකි යැයි ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස කරන වැඩපිළිවෙල දේශය ගොඩනැංවීමේ ජාතික වැඩ පිළිවෙල කෘතිය තුළින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

# 2. ආන්තික ජන කොටස්

## 2.1 කාන්තාව

### 2.1.1 ගෘහස්ථ වශයෙන් පීඩාවට පත්වීම

20. හුසේන්, අමීනා, සමහරවිට රුධිරය නොමැත, ශ්‍රී ලංකාවේ ගම්බද ගෘහ ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය හා ස්ත්‍රී දූෂණය. කොළඹ, ජනවාර්ගික අධ්‍යයන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES). කොළඹ, යුනි ආට්ස් පුද්ගලික සමාගම. පිටු 86.

**අන්තර්ගතය**

ශත වර්ෂ ගණනාවක් ම ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිනොගත්තා පමණක් නොව බොහෝ විට යම් කිසි ක්‍රමයකින් එය නීත්‍යානුකූල කර තිබුණි. සංස්කෘතික පුරුදු, ආගමික විශ්වාස, රාජ්‍ය නීති ආදිය ස්ත්‍රීන් මත ප්‍රචණ්ඩ ක්‍රියා පැට වු අවස්ථා කිහිපයකි. ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අනවශ්‍ය දුෂ්ට දෙයක් ලෙස පිළිගැනුනේ මෑතකදී ය. සරදමකට මෙන් ස්ත්‍රීන් ප්‍රචණ්ඩත්වය පළමුව හඳුනාගත්තේ තම පවුල තුළිනි.

අනුරාධපුර, නුවරඑළිය, මාතර හා මහනුවර යන ප්‍රදේශවල පුළුල් ලෙස හා සවිස්තරව එකතු කරන ලද දත්ත මත සැකසුණු වාර්තාවකි. මෙම වාර්තාව කොටස් 05කට බෙදා ඇත. පළමුවන කොටසින් තහවුරු කරන්නේ පර්යේෂණයේ දී ආවරණය කළ ප්‍රචණ්ඩත්වය දැකිය හැකි ක්ෂේත්‍ර වේ. දෙවන කොටසින් ජාත්‍යන්තර වශයෙන් හා ජාතික වශයෙන් ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නීතිමය දළ සටහනකට දැමේ. තුන්වන කොටසින් ප්‍රකාශ වන්නේ, පර්යේෂණ පිළිබඳ විස්තර හා ක්ෂේත්‍ර පර්යේෂණයේ සාම්පලයන් ය. සිව් මසකට වැඩි කාලයක් තුළ ලබා ගත් ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණයක් සිව්වන කොටසේ අඩංගු වේ. අවසාන කොටසින් දැක්වෙන්නේ ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව ප්‍රතිපත්ති වෙනස්කම් සඳහා වු නිගමන හා නිර්දේශයන් ය.

21. පෙරේරා, මාලීන් කන්‍යා සොහොයුරිය. බයෙන් ජීවත් වන්නේ ඇයි?ඃ කාන්තාවෝ හෙළිදරව් කරති. කොළඹ, සමාජය සහ සාමයික කේන්ද්‍රය. 1999. පිටු 70.

#### අන්තර්ගතය

තුන්වන ලෝකයේ දේව ධර්මාචාරීන්ගේ සාමයික සංගමයේ (EATWOT) ශ්‍රී ලාංකීය කාන්තාවන් විසින්, ජීවිතය උදෙසා අධ්‍යාත්මිකතාවඃ කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම යන තේමාව මත සංවිධානය කළ වැඩමුළුවකින් උපුටා ගත් ලිපි මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් වෙයි. මෙම වැඩමුළුව 1993 සැප්තැම්බර් 30 සිට ඔක්තෝබර් 03 දක්වා වෙන්නප්පුවේ දී පැවැත්වුණි.

EATWOT සංවිධානයේ සාමාජිකයන්ට අමතරව විවිධ ක්ෂේත්‍රවල කාන්තා ක්‍රියාකාරීන් මෙම වැඩමුළුවට සහභාගි විය. ජීවිතයේ අධ්‍යාත්මිකතාවය කරා උපත දෙන්නට, ප්‍රචණ්ඩත්වයට එරෙහි ස්ත්‍රීන්ගේ අරගලය එක් කළ හැකි දේව ධර්මයක හා ක්‍රියාකාරී වීමට උපායන් සොයන්නට සහ ගැහැණිය ප්‍රචණ්ඩත්වය සමග ගනුදෙනු කරන ආකාරය වටහා ගන්නටත් මෙම ලිපි මාලාවෙන් හැකි වනු ඇත.

සමාජ සංස්කෘතික, ආගමික, දේශපාලන හා සන්නද්ධ සහ ආර්ථික හා ගෘහස්ථ වශයෙන් සමාජයේ ව්‍යාප්තව පවතින ප්‍රධාන අංශ හතරක් තුළ කාන්තාවන්ට එරෙහිව පවතින ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිතන්නට බොහෝ කරුණු මෙම ලිපි මාලාවේ සඳහන් ජීවන පුවත් තුළින් සපයා ඇත. ප්‍රචණ්ඩත්වයට ලක් වීම සහ එහි මනෝ විද්‍යාත්මක සහ භාවමය බලපෑම් මෙන් ම විශාල වශයෙන් කාන්තාවන්ටත් සමාජයටත් ඉන් සිදු වන විපාකයන් පිළිබඳ මෙහි දී සාකච්ඡාවට බඳුන් කර ඇත.

22. ප්‍රනාන්දු, විජිතා. ඇය (ප්‍රචණ්ඩත්වය ගැන සත්‍ය කතා). කොළඹ, සමාජය සහ සාමයික කේන්ද්‍රය. 1991. පිටු 107. ISBN 1391 - 0620.

#### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ බොහෝ නිවෙස් වල උගත්, නූගත්, ග්‍රාමීය හා නාගරික පවුල් තුළ පුරුෂ ප්‍රචණ්ඩකාරී පරිසරය පදනම් වී ඇත්තේ අතිශය ප්‍රාථමික න්‍යායක් වන බලය නිවැරදිය යන්න මතයි. එය පීතෘ මූලික පවුලේ පදනමයි. පුවත්පත් වාර්තාවලටත් වඩා විනාශකාරී කොටස් ජයග්‍රහණය කරනු ලබයි. හිංසාවට අනුබල දෙන ප්‍රචණ්ඩත්වය, පිරිමිකම, ලෙස ප්‍රශංසාවට ලක් කරන ඇගයීම් පද්ධතියක් ලොව පුරා පැතිරී ඇත. ස්ත්‍රියට එරෙහිව පවතින ප්‍රචණ්ඩත්වය පිටුදැකීමට ප්‍රතික්‍රියාවක් ලෙස සමාජ සංවිධාන රැසක් ස්ත්‍රීන් අතර නිර්මාණය වී ඇත. ස්ත්‍රියට එරෙහි ප්‍රචණ්ඩත්වය හා එයට එරෙහි ක්‍රියාකාරීත්වයන් පිළිබඳ ලෝකයේ විවිධ රටවල පවතින තත්ත්වය සහ ඒ සම්බන්ධව

ශ්‍රී ලංකාව තුළ පවතින තත්ත්වය සහ නීතිය හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ සත්‍ය තොරතුරු මෙම කෘතිය තුළින් සාකච්ඡා කරයි. ප්‍රචණ්ඩත්වයට ගොදුරු වුණු ස්ත්‍රීන් සහ ගැහැණු දරුවන් පිළිබඳ සිද්ධි අධ්‍යයන ඇතුළත් ය.

23. රාජකරුණානායක, සුනේත්‍රා, අපේ දවස, කොළඹ, අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය (ITDG). 1997. කොළඹ, ගුණරත්න ඔෆ් සෙට් ලිමිටඩ්. පිටු 112.

### අන්තර්ගතය

අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය විසින් සිදු කළ, ඇයගේ හැකියාවන්, (DO it her self) වැඩසටහනේ සමීක්ෂණ සටහනකි. එම සමීක්ෂණය කාන්තාවන්ගේ පළපුරුද්ද, පාරම්පරික දැනුම සහ තාක්ෂණික හැකියාවන් සොයා බැලීම සඳහා සිදු කරන ලද්දකි. සමීක්ෂණ තොරතුරු පදනම් කරගෙන ඒවා ශ්‍රී ලාංකික ස්ත්‍රීන් අතර ප්‍රකාශයට පත් කිරීම සඳහා නවලිය කාන්තා පුවත්පතේ, මැඩම් ටේස්ට්, නමින් විශේෂාංගයක් පළ කෙරුණි. මා දවස ගෙවන ආකාරය යටතේ ලිපි එවන්නැයි එම විශේෂාංග පිටුවේ විවෘත ආරාධනාවක් පළ කරන ලදී. මෙම පොතෙහි සඳහන් සියළුම ලිපි ඊට ලද ප්‍රතිචාර වේ. තම තමාගේ එදිනෙදා කටයුතු තුළ වැදගත් යයි හැඟෙන දේ ඔවුන් විසින් ම පෙළ ගස්වා ඇත. ස්ත්‍රීන් 40 දෙනෙකුගේ දින වාර්තා ලිපි ඇතුළත් මෙම පොත සාමාන්‍ය ස්ත්‍රියගේ ජීවිතයේ කැඩපතක් වැනි ය.

### 2.1.2 රැකියා/ආදායම් උත්පාදන කටයුතුවල දී පීඩාවට පත්වීම

24. අබේසේකර, සුනිලා. අරගලයේ ස්ත්‍රීහු (1980- 86). කොළඹ, කාන්තා අධ්‍යාපන කවය. 1998. පිටු 45.

### අන්තර්ගතය

පසු ගිය දශක දෙක තුළ, ලංකා ඉතිහාසයේ මෑත යුගයේ නොවූ තරමට ස්ත්‍රීහු ශ්‍රම බලකායට එක් වී සිටිති. නා නා මාදිලියේ සමාජ ප්‍රතිසංස්කරණ, අධ්‍යාපනික දොරටු විවෘත වීම පොදුවේ ලාංකික ජනතාවගේ උගත් භාවය සහ සෞඛ්‍ය සම්පන්න භාවය දියුණු වීම, සංස්කෘතික ක්ෂේත්‍රයේ යල් පැන ගිය සම්ප්‍රදායික තහංචි ආදිය ඉවත ලෑම ආදී සාධක රැසක් හේතුවෙන් ස්ත්‍රීන් ශ්‍රම වෙළෙඳපළ වෙත තල්ලු විය. ශ්‍රම වෙළෙඳපළේ දී ස්ත්‍රීන් වෙත එල්ල වුණු අසාධාරණය සහ අයුක්තිය වෙනුවෙන් ඔවුන් කරන ලද අරගලයේ තොරතුරු බිඳක් මෙම කෘතිය තුළ අඩංගු වේ.

25. පෙරේරා, ජයන්ත, ර්. ජී./ ජිනපාල, කේ. තෙල් ආකර තුළින් ගලන රට සල්ලි. කොළඹ, සමාජය සහ සාමයික කේන්ද්‍රය. 1989. පිටු 56.

**අන්තර්ගතය**

(මෙම අධ්‍යයනය උඟරගස්මන්හන්දිය, කිරුළපන, බලංගොඩ සහ තල්ගස්වැව යන ප්‍රදේශවල 1986 වර්ෂයේදී සිදුකර ඇත.)

මැද පෙරදිග රටවලින් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රධානතම රැකියා පුරප්පාඩුව වන්නේ ගෘහ සේවිකා වෘත්තියයි. එමෙන් ම ශ්‍රී ලංකාවෙන් මැද පෙරදිගට ඇදෙන රැකියා අපේක්ෂිතයන් අතර විශාලත ම කණ්ඩායම වන්නේ ද ගෘහ සේවිකාවන් ය. කාන්තාවන් තම පවුලේ පවතින ආර්ථික දරිද්‍රතාවයෙන් ගැලවීම සඳහා ගෘහ සේවිකාවන් ලෙස මැද පෙරදිග යාමට යොමු වී ඇත. මෙම හේතුව නිසා සමහර අවස්ථාවල දී ඔවුන්ගේ පවුල් සංස්ථාව සහ මෙතෙක් පැවැති ආර්ථික සහ සමාජ පදනම ද කඩාකප්පල් වන අවස්ථා ඇත. විවිධ පුද්ගලයන් සහ සංවිධාන මගින් රැකියා සඳහා මැද පෙරදිග යාම හා ඒ ආශ්‍රයෙන් පැන නගින විවිධ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳ සමාජය තුළ නොයෙක් අදහස් ඇත. ඒවා හුදෙක්, පුවත්පත් වාර්තාවලට පමණක් සීමා වේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ අවධානය මෙම ගැටළුකාරී අවස්ථාව අධ්‍යයනය කිරීමට යොමු කරවාලීමට සහ මෙම ගැටළුවේ යථා තත්ත්වය හා එය ශ්‍රී ලාංකික සමාජයට බලපා ඇති අයුරු හෙළිදරව් කිරීම මෙම ප්‍රකාශනයේ මූලික පර්මාර්ථය වේ.

26. අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය., තාක්ෂණවේදීන් සොයමු, වීඩියෝ චිත්‍රපටය. කොළඹ, අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය. 2001.

**අන්තර්ගතය**

ස්ත්‍රීන් තමන්ගේ එදිනෙදා ගෙදරදොර වැඩ කටයුතුවල දී හෝ ආදායම් උපදවන කටයුතුවල දී මුහුණ දෙන නොයෙකුත් ගැටළු මෙන් ම ඒවාට මුහුණ දීම සඳහා ඔවුන් නිර්මාණශීලීව සහ උත්සාහයෙන් යුතුව කරන නිපැයුම්, සාදා ගන්නා ක්‍රමවේද ආදිය ගැන මෙම වීඩියෝ චිත්‍රපටයෙන් සාකච්ඡා කෙරේ. නොයෙකුත් බාධක සහ අභියෝග හමුවේ තමන්ට තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගනිමින් තම දැනුම හා කුසලතා නව නිම් වළලූ වෙත ගෙන යෑමට ස්ත්‍රීන්ට හැකි අයුරු මෙ මගින් අංශ කිහිපයක් යටතේ විදහා දැක්වේ. කාන්තාව සහ තාක්ෂණය පිළිබඳ පරිපූර්ණ තොරතුරු ගෙනහැර දැක්වීමක්

නොවන, "තාක්ෂණවේදීන් සොයමු", වීඩියෝ චිත්‍රපටය, ස්ත්‍රීන්ගේ තාක්ෂණික දැනුම, කුසලතා හා ඔවුන් ජීවිතයට මුහුණ දෙන ධෛර්යවන්ත හා නිර්මාණශීලී ආකාරය ගැන කෙටි සටහනක් ඔබ හමුවේ ගෙන හැර තබයි. මෙම වාර්තාමය වීඩියෝ චිත්‍රපටය අයි ටී ඩී ජී ආයතනය විසින් 1992 දී ආසියානු අප්‍රිකානු හා ලතින් ඇමරිකානු කලාපීය රටවල් කිහිපයක කළ, ඇයගේ හැකියාවන්, (DO it her self) නම් පර්යේෂණය පදනම් කරගෙන නිපදවන ලද්දකි.

27. වීරසිංහ, තිළිනා. ස්ත්‍රීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි සුළු පරිමාණ ණය ව්‍යාපෘතීන්. කොළඹ, සමාජය සහ සාමායික කේන්ද්‍රය. 2003. පිටු 70. ISBN 1391-0620.

### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ දිළිඳු කාන්තාවන්ගේ ජීවන තත්ත්වය කෙබඳුද යන්න පිළිබඳව නුවරඑළිය දිස්ත්‍රික්කයේ නිශ්චිත ප්‍රදේශයක් අළලා 2002 ජූලි මාසයේ දී සිදු කළ විමර්ශනාත්මක පර්යේෂණයක් මෙම කෘතියට ඇතුළත් වේ. මෙරට රාජ්‍ය නොවන සංවිධාන ස්ත්‍රීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා මැදිහත් වීමේ ක්‍රියාවලිය වර්තමාන ලාංකික ස්ත්‍රීන්ගේ දෛනික ජීවන තත්ත්වයන් තුළ කවර ආකාරයකට පත් වී තිබේද යන්න මේ තුළින් විමසුමට ලක් කර ඇත. රාජ්‍ය නොවන සංවිධාන කොතෙක් දුරට සිය සංවර්ධන ඉලක්ක සපුරාගෙන තිබේද යන්න මෙම පර්යේෂණය තුළින් තරමක් දුරට හෝ අවබෝධයක් ලබා ගැනීමට හැකි වෙයි.

28. රමණී ජයතිලක. ගෝලීයකරණය සහ ග්‍රාමීය කාන්තාව. කොළඹ, සමාජය සහ සාමයික කේන්ද්‍රය. 2000. පිටු 101. ISBN 1391-0620.

### අන්තර්ගතය

ගෝලීයකරණ ක්‍රියාවලිය මගින් කාන්තාව මත ඇති කරන බලපෑම පිළිබඳව ගාල්ල දිස්ත්‍රික්කයේ ගම් දෙකක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ පර්යේෂණාත්මක අධ්‍යයනයකි. ගාල්ල දිස්ත්‍රික්කයේ අහුංගල්ල සහ ඇත්කඳුර යන ප්‍රදේශවලින් රැකියා අවස්ථාවන්හි ප්‍රමුඛතාවය පදනම් කරගෙන මෙම ගම් දෙක තෝරා ගෙන ඇත.

පාරම්පරික කෘෂිකාර්මික කටයුතුවල දී හා ගෙදරදොර වැඩපළවල දී කාන්තාවන්ගෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉෂ්ට වන බැවින් ආර්ථික කටයුතුවලට ග්‍රාමීය කාන්තාවන්ගේ සහභාගිත්වය ඇත්ත වශයෙන් ම නව පෙළගැස්මක් නොවේ. කෙසේ වෙතත්. නිෂ්පාදන ගෝලීයකරණය, සංක්‍රමණික

ශ්‍රමය හා සංචාරක ව්‍යාපාරය සමග කාන්තාවන්ගේ කටයුතුවල ද බොහෝ වෙනස්කම් හා පැතිකඩවල් දැකිය හැකි විය.

ගෝලීයකරණ ක්‍රියාවලිය හේතු කොටගෙන ග්‍රාමීය කාන්තාව සඳහා නිර්මාණය වී ඇති නව ආර්ථික අවස්ථා කවරේද? මෙම නව ආර්ථික ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ තත්ත්වය කෙබඳුද? කාන්තාවන්ගේ විවාහය, හා ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවල දී ගෝලීයකරණය මගින් ඇති කර තිබෙන බලපෑම සහ නව ගෝලීයකරණ සමාජය තුළ කාන්තාවන් ග්‍රාමීය සංස්කෘතිය තුළ ඇති කර තිබෙන බලපෑම පිළිබඳ කරුණු පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනය මගින් සිදු කර ඇත.

### 2.1.3 පුහුණු අත්පොත් - ස්ත්‍රී පුරුෂ සමාජභාවය

29. ප්‍රජා අධ්‍යාපන සංගමය (ශ්‍රී ලංකා). ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය (පුහුණු අත්පොත). කොළඹ, ප්‍රජා අධ්‍යාපන සංගමය (ශ්‍රී ලංකා). 1997. කැළණිය, විද්‍යාලංකාර මුද්‍රණාලය. පිටු 177. ISBN 955 8098-0-0.

#### අන්තර්ගතය

මෙම අත්පොත සැකසී ඇත්තේ ග්‍රාමීය මට්ටමේ සුළු පරිමාණ ව්‍යවසායකයින් වර්ධනය කිරීම සඳහා ය. මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සිටින අතර ඔවුන් සඳහා ද නියමිත පුහුණුවීම් ඇත. එහෙත් මෙම අත්පොත ඍජුවම යොමු වන්නේ සුළු පරිමාණ ව්‍යවසායකයින් පුහුණු කිරීම සඳහා ය. විශේෂයෙන් ලංකාවේ බහුලව දක්නට ලැබෙන්නේ ආදායම් ඉපැයීමේ වැඩසටහන් ය. එබඳු සුළු පරිමාණ අංශ සඳහාත්, ස්වයං රැකියා කරන්නන් පුහුණු කිරීම සඳහාත් මෙම අත්පොත යොදා ගත හැකි ය.

සමාජ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ සහභාගිත්වයේ පවතින ගැටළු පුළුල්ව විග්‍රහයට ලක් කළ යුතුව ඇත. ව්‍යවසායකත්වය පිළිබඳ විග්‍රහ කිරීමේ දී ආර්ථික ක්‍රියාදාමය තුළ පවතින ගැටළු අවධානයට යොමු වීම වැදගත් ය. ආර්ථික සම්පත් ළඟා කර ගැනීම සමාජයේ කුමන අංශයට යොමු වන්නේද යන්න විමසීමට ලක් කළ යුතු අතර අදාළ සම්පත්වල පාලනය පිළිබඳ ප්‍රායෝගික අංශ පිළිබඳවද සාකච්ඡා කළ යුතුව ඇත. අධ්‍යාපන, දේශපාලන, සංස්කෘතික යන අංශ ඔස්සේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවයේ යථා තත්ත්වය විග්‍රහ කිරීම සම්බන්ධයෙන් මෙහි දී අවධානය යොමු කිරීම වඩාත් අවශ්‍ය ය. සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ ව්‍යාපෘති සහ සංවර්ධන වැඩසටහන්වල විවිධ පියවර ඔස්සේ සහභාගිත්වයේ දැනට පවතින තත්ත්වය සහ වෙනස්

විය යුතු අංශ පුළුල් ලෙස විග්‍රහ කිරීමට මෙහි දී අවධානය යොමු කළ යුතු ය. මෙම අත්පොතෙ හි එල්ලය ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ යොමු කර තිබෙන්නේ ඉහත විග්‍රහ කළ අංශ වඩාත් පුළුල්ව අවධානයට යොමු කිරීම සඳහා ය.

30. ප්‍රනාන්දු, ප්‍රියන්ති, විජයතිලක, සුජාතා/ ඇපල්ටන්, හෙලන්. තාක්ෂණවේදීන් සොයමු. කොළඹ, අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය (ITDG). 2001. මහනුවර, මීඩියා විෂන් ප්‍රයිවට් ලිමිටඩ්. පිටු 98.
ISBN 955-9417-10-X.

**අන්තර්ගතය**

ස්ත්‍රීහු, පිරිමින් මෙන් නොව, වැඩි පවුල් වගකීම් රැසක් දරමින් වැඩි පැය ගණනක් දිනපතා වැඩ කරති. එනමුදු, ඔවුන්ගේ දායකත්වයට සමාජයෙන් ලැබෙන්නේ අඩු වටිනාකමක් හා අඩු තක්සේරුවකි. සංවර්ධන සැළසුම් සහ වැඩසටහන් නිරතුරුව පිළියෙල වන්නේ ස්ත්‍රීන්ගේ දායකත්වය හෝ ඒවායින් ස්ත්‍රීන්ගේ ජීවිතවලට සිදුවන බලපෑම ගැන නොසැලකීමෙනි.

ස්ත්‍රීහු දිනපතා කටයුතුවල දී, කාර්මික කුසලතා හා දැනුම පාවිච්චි කරති. ඔවුහු නිරන්තරව, තමන් වෙත ඉදිරිපත්වන බාධකවලට පිළිතුරු වශයෙන් නව නිපැයුම් කරන අතර, තාක්ෂණය අවශ්‍ය පරිදි යොදා ගැනීමට ද කටයුතු කරති. කෙසේ නමුත් මෙම තාක්ෂණික දායක වීම නොයෙක් හේතූන් නිසා ජනතා ඇසට නොපෙනෙන තත්ත්වයක පවතියි. අවශ්‍යතාවයන්ට අනුව තාක්ෂණය සකසා ගැනීමට ස්ත්‍රීන්ට ඇති හැකියාව සමාජයට නොපෙනී යාම සිදු වනුයේ නව තාක්ෂණය හා තාක්ෂණික කුසලතා දියුණු කර ගැනීමට ස්ත්‍රීන්ට නිසි අවස්ථාවක් නොලැබීමෙනි. "තාක්ෂණවේදීන් සොයමු" පුහුණු අත්පොත ඔබ අතට පත් වෙන්නේ ස්ත්‍රීන් සහ පුරුෂයන් තාක්ෂණය භාවිතයෙන් දක්වන විවිධ ප්‍රතිචාර හා ඔවුන්ට ඒ සම්බන්ධයෙන් ඇති බලපෑම පිළිබඳ ඔබගේ අවධානය යොමු කිරීමටයි.

ප්‍රජා සංවර්ධනයේ දී ස්ත්‍රීන් සහ පුරුෂයන් සමග කටයුතු කරමින් ඔවුන් සමග තාක්ෂණය යොදාගෙන සංවර්ධන කාර්යයන්හි නියැලෙන ක්ෂේත්‍ර සේවක පිරිසගේ කුසලතා වර්ධනයට මෙම පුහුණු අත්පොත ප්‍රයෝජනවත් මෙවලමක් වනු ඇත.

### 2.1.4 යුද්ධය/ අරගල නිසා පීඩාවට පත්වීම

31. සමාජවාදී කාන්තා සංගමය. අරගලයක පිය සටහන්. කොළඹ, සමාජවාදී කාන්තා සංගමය. 2001. නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්. පිටු 203. ISBN 955-8546-00-3.

#### අන්තර්ගතය

ලොව පුරා කාන්තා ව්‍යාපාරවල බිහි වීම සහ ඒවායේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසා බලන මෙම කෘතිය කාන්තා දේශපාලනය ගැන ලියවී ඇති කෘති අතර වැදගත් තැනක් ගනු ලබයි. සමස්ත ඉතිහාසය ම සවිස්තරාත්මකව සඳහන් වන්නේ නැත. එහෙත්, සීමිත තොරතුරු ප්‍රමාණයක් පවත්නා සහ පැවති දේශපාලන සමාජ සහ ආර්ථික සන්දර්භය තුළ තබා විශ්ලේෂණය කර ඇත. සැබෑ කාන්තා විමුක්තිය ලැබිය හැක්කේ හුදෙකලා අන්තවාදී අරගල තුළින් නොවේ. පීඩිත පොදු ජනයාගේ විමුක්තිය තුළ කාන්තා විමුක්තියේ මාර්ගය ද වැටී ඇත. ඒ බව මෙම පොතේ සඳහන් ඉතිහාසමය තොරතුරුවලින් අනාවරණය වේ.

මෙම කෘතිය තුළින් ලෝකයේ ම කාන්තා ව්‍යාපාර පිළිබඳ කෙටි අධ්‍යයනයක් සිදු කර ඇත. එහි දී ධනවාදී මෙන් ම සමාජවාදී වශයෙන් වෙන වෙන ම කරුණු ගෙන හැර දක්වා ඇත. ලාංකීය කාන්තාවන්ගේ අරගල ඉතිහාසය සිසාරා යමින් ධනේශ්වර, වාමාංශික හා විප්ලවවාදී ව්‍යාපාරයන් තුළ කාන්තා සහභාගිත්වය පිළිබඳ විමසීමක් සිදු කර ඇත.

32. ජයවීර, ස්වර්ණා සහ ගුණරත්න, කාමිණී. සුළුතර කොටස් සහ කාන්තා හා ළමා අයිතිවාසිකම්. කොළඹ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම. කොළඹ, යුනි ආට්ස් (පුද්:) සමාගම. පිටු 28. ISBN 955-582-102-X.

#### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ සිංහල බහුතර ජනතාවට අමතරව ජන වාර්ගික වශයෙන් සුළුතර කොටස් සිටිති. ශ්‍රී ලංකා දෙමළ, ශ්‍රී ලංකා යෝනක, වතු කම්කරු වැනි මෑතකදී පැමිණි ඉන්දියානු දෙමළ ජනයා, මැලේ සහ බර්ගර් ජනයා ශ්‍රී ලංකාව තුළ ජන වාර්ගික වශයෙන් සුළුතර කොටස් වේ. එයට අමතරව දේශීය ජන කණ්ඩායමකින් පැවත එන ඌව පළාතේ පදිංචි වැදි ජනතාව ද සුළුතර කොටසකි. ආගමික වශයෙන් ජනගහනයෙන් බහුතරය බෞද්ධ වන අතර, හිංදු, රෝමානු කතෝලික හා අනෙකුත් ක්‍රිස්තියානි කොටස් සුළුතර කොටස් වෙති.

ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව භාෂා ප්‍රතිපත්තිය නිසා අවාසිදායක තත්ත්වයකට පත්ව සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජන වාර්ගික ගැටුම් ඇති විය. මුස්ලිම් කාන්තාවන්ගේ ප්‍රගතිය අඩපණ කරන සමාජ සංස්කෘතික නීති නිසා ඔවුහු පැහැදිලිව ම වෙනස්කම්වලට භාජනය වී සිටිති. වතුකරයේ දෙමළ ප්‍රජාවට දායද වී පවතින සමාජ ආර්ථික අවාසිදායක තත්ත්වය මත ස්වාධීන ශ්‍රී ලංකාවේ ඇති වූ සමාජ සංවර්ධනය ඔවුන් කෙරෙන් මගහැරී ගොස් ඇත. වතුකරයේ කාන්තාවෝ විවෘත පුරුෂාධිපත්‍යයට හා ලිංග භේදය මත අසමානතාවට පාත්‍ර වෙති. වතුකරයේ ළමා ශ්‍රමය ලබා ගැනීම මෑතක් වන තුරුම ඉහළ මට්ටමක පැවතුණි.

පුරාණ වාස භූමිවල ජීවත් වන වැදි ජනයා සමාජ බැහැර කිරීම්වලට ගොදුරු වී සිටිති. ඔවුන් මහවැලි ප්‍රදේශවල පදිංචි කරවා ඇතත්, සමාන අවස්ථා නොලැබී යාමක් දක්නට ඇත.

නොසලකා හැර ඇති කුල කණ්ඩායම් තනි වූ ප්‍රජා කොට්ඨාශ වශයෙන් ජීවත් වේ. නොඑසේනම්, තැනින් තැන යන පවුල් වශයෙන් ජීවත් වේ.

ඔවූහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී වෙනස්කම්වලට භාජනය වෙති. එහෙත්, මෙම සියළු ජන කොටස්වල පුරුෂයන්ගේ, කාන්තාවන්ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පයට ඇතුළත් වී තිබේ.

2001 පැවැති ජන සංගණනය අනුව මෙම සියළු ජන කොටස්වල කාන්තා හා ගැහැණු දරුවන්ගේ ජනගහනය සම්පූර්ණ ජනගහනයෙන් අඩකටත් වඩා වැඩි ය. එම නිසා සුළුතර ජන කොට්ඨාශවල වුව ද කාන්තාවන් සහ ගැහැණු දරුවන් සුළුතරයන් නොවේ. එහෙත්, සම්පත් සහ සේවා ලබා ගැනීමේ දී ඔවුන් පිරිමි සහ පිරිමි දරුවන් සමග සංසන්දනය කිරීමේ දී අවාසිදායක තත්ත්වයකට පත්ව ඇත. ජන වාර්ගික ප්‍රජා කොට්ඨාශවල පුද්ගලික නීති සහ සමාජ සංජානන හා භාවිත අනුව ඔවුහු වෙනස්කම්වලට භාජනය වෙති. බහුතර ප්‍රජාවට අයත් කාන්තාවන් සේම, සුළුතර ප්‍රජා කොටස්වල අයත් කාන්තාවෝ සහ ගැහැණු දරුවෝ වෙනස්කම්වලට මුහුණ දෙති. එය බොහෝ විට බහුතර ප්‍රජාවේ කාන්තාවන්ට බලපාන අසමානතාවයට වඩා දෙගුණයකින් වැඩි විය හැක.

නෛතික රාමුව සහ සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩසටහන්වල කාන්තාවන්ගේ සහ ළමුන්ගේ අයිතිවාසිකම් හා සුළුතර කොටස්වල අයිතිවාසිකම් එකට සම්බන්ධ වන ප්‍රදේශ මෙම පොත් පිංච මගින් සොයා බලනු ලැබේ.

## 2.2 ළමුන්

### 2.2.1 යුද්ධය නිසා පීඩාවට පත්වීම

33. විමලධර්ම, සරා/සිල්වා ද, අමරසිරි/සිල්වා ද, නිලක්ෂි. යුද්ධයත් සමගම වැඩීම, ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත් ළමුන්ගේ අත්දැකීම්. කොළඹ, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA). 2006. හෝමාගම, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 36. ISBN: 955-1040- 31- 07.

#### අන්තර්ගතය

ශ්‍රී ලංකාව තුළ පවතින සන්නද්ධ ගැටුම නිසා ළමුන් පීඩාවට පත් වන්නේ කෙසේද යන්න පිළිබඳ සොයා බලා ඒ පිළිබඳ අවබෝධය තවදුරටත් පුළුල් කර ගැනීම මෙම පර්යේෂණ කෘතියේ අරමුණයි. මේ සඳහා ඉලක්ක ගත වී ඇත්තේ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක 03 කි. සන්නද්ධ ගැටුම ඍජුව මෙන් ම වක්‍රව ද දරුවන්ගේ ජීවිතවලට ඉතා පීඩාකාරී ලෙස බලපා ඇත. පාසල් නිරතුරුව වසා දමා තිබීමත්, ගැටුම් පවතින කාලවලට ගුරුවරුන් පාසලට නොපැමිණීමත් නිසා ඔවුන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතියට බාධා පැමිණ ඇත. මරණය, ආබාධිතභාවය, පවුලේ සාමාජිකයන් අහිමි වීම සහ විස්ථාපනය ආදී වශයෙන් ගැටුම ළමුන් කෙරෙහි බලපා ඇත.

මෙම කෘතිය සඳහා අධ්‍යයනයට ලක් වුණු සෑම නිවසක් ම ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස අන්ත දිළිඳු බවට පත් වී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ යුදමය තත්ත්වයක් පැවතීම හේතුවෙන් මෙම ප්‍රදේශවල යටිතල පහසුකම්, ආදායම් මාර්ග ප්‍රමාණවත් නොවන මට්ටමක පැවතීම වැනි හේතු ද මෙම කලාපයේ ජීවත් වන දරුවන්ගේ ජීවිත පීඩාකාරී තත්ත්වයට පත් කරලීමට හේතු වී ඇත.

34. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Unisef). ලෝකයේ වෙසෙන දරුවන්ගේ තත්ත්වය-2000. නිව්යෝර්ක්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල. 2000. පිටු 116.

#### අන්තර්ගතය

1990 දී ලෝකයේ දරුවන් වෙනුවෙන් පැවැත් වූ ලෝක රාජ්‍ය නායක සමුළුවේ දී එළඹගත් ඉලක්ක ජය ගැනීම සඳහාත් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ දැක්වෙන පරමාර්ථ පෙරදැරි කරගෙනත් පසුගිය දශකය තුළ දී ලබා ඇති ප්‍රගතිය මෙම වාර්තාවේ සාරාංශ ගත වී ඇත. එසේ ම දශකයකට පෙර පැවැති දර්ශනය හා බලාපොරොත්තු හා වර්තමාන යථාර්ථය අතර පවත්නා අසමානකම් ද මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

යුද්ධය සහ කලකෝලාහල නිසා පසුගිය දශකය තුළ දී කාන්තා හා ළමා අපයෝජන තත්ත්වයන් බොහොමයක් දක්නට ලැබුණි. මෙම වාර්තාව මානව සංවර්ධනයට ප්‍රධාන බාධකයක් ලෙස පවතින කරුණු අතරින් ප්‍රධාන කරුණු 04ක් සාකච්ඡා කරනු ලබයි. එනම් HIV ඒඩ්ස්, යුධ ගැටුම් සහ කලකෝලාහල, දුප්පත්කම වැඩි වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ වෙනස් කම පිළිබඳවයි.

### 2.2.2 වරප්‍රසාද අහිමි වීම නිසා පීඩාවට පත්වීම

35. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Unisef). ලෝකයේ වෙසෙන දරුවන්ගේ තත්ත්වය- 2004 (ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය සහ සංවර්ධනය). නිව්යෝර්ක්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල. 2004. කොළඹ, ග්‍රැෆික් සිස්ටම්ස්. පිටු 139. ISBN 92-806-3784-5.

**අන්තර්ගතය**

ගැහැණු ළමයෙකු හට අධ්‍යාපනය ලබා දීම යනු මුළු පවුලටම අධ්‍යාපනය ලබා දීමකි. පවුල් සඳහා සත්‍ය වන දෙය ප්‍රජාවන්ට ද සත්‍ය වනවා මෙන් ම අවසානයේ දී රටවල් සියල්ලට ම සත්‍ය වෙයි. අධ්‍යයනයෙන්, අධ්‍යයනයට අපට උගන්වා ඇත්තේ ගැහැණු ළමයින් හට අධ්‍යාපනය ලබා දීම තරම් සංවර්ධනය සාර්ථක කරවන වෙනත් මෙවලමක් නොමැති බව ය. වෙනත් කිසිදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම තුළින්, ආර්ථික ඵලදායීතාව නංවාලීමට, ළදරු හා මාතෘ මරණ පහත හෙළීමට, පෝෂණය නංවාලීමට සහ ඒඩ්ස් පැතිරවීම වැළැක්වීමට උදව් දීම ද ඇතුළත් ව සෞඛ්‍ය ප්‍රවර්ධනයට මෙතරම් සමත් විය හැකියයි සිතිය නොහැකි ය. මීළඟ පරම්පරාවට අධ්‍යාපනය ලැබීමේ ඇති අවස්ථාව ඉහළ දැමීමට ද මෙතරම් බල සම්පන්න වෙනත් ප්‍රතිපත්තියක් නොමැත. එහෙත් ලෝකයේ වෙසෙන ගැහැණු ළමුන් මිලියන ගණනාවක් පාසල් නොයයි. තවත් මිලියන ගණනාවක් ගැහැණු දරුවන් තම අධ්‍යාපනය සම්පූර්ණ කර නොගනියි.

2004 ලෝකයේ වෙසෙන දරුවන්ගේ තත්ත්වය දක්වන Unisef වාර්තාව තුළින් වැඩි අවධානය යොමු වී ඇත්තේ ලෝකයේ වෙසෙන ගැහැණු සහ පිරිමි දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ලබා දීම සහ විශේෂයෙන් ම ගැහැණු දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ පවතින සමාජමය වැදගත්කම පිළිබඳව ය.

දරුවන්ගේ යහ පැවැත්ම කෙරෙහි විශේෂ අවධානයක් සහිතව ලෝකයේ රටවල් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් බල ප්‍රදේශවල ආර්ථික සහ සමාජ සංඛ්‍යාන දත්ත ඇතුළත් ය.

36. ජයසුන්දර, ලාල්. ළමා අයිතිවාසිකම්, මානව හිමිකම් සහ සමාජ වගකීම් (මානුෂික නීතියට පෙරවදනක්). ගම්පොළ, ක්‍රිස්ටල් ග්‍රැෆික්ස්. 2005. පිටු 72. ISBN 955-9666-27-4.

### අන්තර්ගතය

සමාජයේ ජීවත් වන පුරවැසියන්ට ජීවත් වීමේ අයිතිය සහ ගෞරවනීය පැවැත්ම සඳහා දැනුම, බුද්ධිය සහ ආකල්පමය වෙනසක් අවශ්‍ය වේ. ඒ සම්බන්ධයෙන් පවතින දැනුම පිපාසය වෙනුවෙන් මෙම ග්‍රන්ථය සකස් කර ඇත. නීති පොතක් නොව ආකල්පමය වෙනසක් උදෙසා මෙම ප්‍රයත්නය දරා ඇත. එම නිසා ළමයා පාදක කරගනිමින් මානව හිමිකම් සහ සමාජ වගකීම් පිළිබඳ කතා කළෙමි. මේ සඳහා ළමයා තරම් සුදුසු මැදිහත්වන්නෙකු හෝ උත්ප්‍රේරකයක් තවත් නොමැත.

අයිතිවාසිකම් අහිමි වුණු දරුවෝ මේ වන විට ළමා සොල්දාදුවන්, ළමා ශ්‍රමිකයන්, ඒඩ්ස් රෝගීන් සහ වීදි දරුවන් බවට පත්ව සිටියි. වැඩි දෙනා ළමා අයිතිවාසිකම් සහ මානව හිමිකම් ආරක්ෂා කිරීමට අවනත වෙති. එහෙත් එයට එරෙහිව ළමයින්ට ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුම එපා යැයි පවසන වැඩිහිටියෝ ද සිටිති. මෙම ග්‍රන්ථය ළමා අයිතිවාසිකම්, මානව හිමිකම් සහ සමාජ වගකීම් පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරනු ලබයි.

37. මාර්ග ආයතනය. ශ්‍රී ලංකාවේ ළදරුවන් හා ගැටවරයන්ගේ අවශ්‍යතා. කොළඹ, මාර්ග ආයතනය. 1976. කොළඹ, ස්වස්තික මුද්‍රණාලය. පිටු 140.

### අන්තර්ගතය

එක්සත් ජාතීන්ගේ ළදරු අරමුදලේ අනුග්‍රහයෙන් රටවල් කිහිපයක් සම්බන්ධයෙන් පවත්වනු ලැබූ පූර්ව පාඨශාලීය හා ගැටවර වියෙහි පසුවන තරුණ වයස් කාණ්ඩයන් පිළිබඳව කරනු ලබන අධ්‍යයනයන්ගෙන් එකකි.

ශ්‍රී ලංකාවේ මෙම වයස් කාණ්ඩයන් සඳහා සපයනු ලබන අධ්‍යාපනික, සෞඛ්‍යමය, පෝෂණමය හා විනෝදාංශමය සේවාවන්ගේ ප්‍රාදේශීය විචලනයන් මෙහි විශේෂයෙන් ම විග්‍රහ කෙරේ. ශ්‍රී ලංකාවේ ළදරුවන් සහ ගැටවරයන්ගේ මෙම අවශ්‍යතාවයන් සපුරාලීමට වුවමනා වන ඒකාබද්ධ සැළැස්මක සැකිල්ලක් මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කරනු ලැබේ. ළදරුවන් හා ගැටවරයන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ පවත්නා තත්ත්වය විස්තර කිරීමටත් විග්‍රහ කිරීමටත් මෙම අධ්‍යයනය උත්සාහ කරයි. විධිමත් අධ්‍යාපනය, පාසැලෙන් බැහැරව ලබන උගැන්ම, සෞඛ්‍ය හා විනෝදාංශය යන ප්‍රධාන

අංශ හතර සම්බන්ධ කොට ගෙන මෙම අවශ්‍යතාවයන් පරීක්ෂා කෙරේ. මේ හැම අංශයකම සපයා ගත හැකි දත්ත ගොනු කර ඇති අතර සෞඛ්‍ය, විධිමත් අධ්‍යාපනය, නිර්විධිමත් අධ්‍යාපනය හා විනෝදාංශ යන විවිධ ක්ෂේත්‍රයන්හි ළදරුවන්ගේ හා ගැටවරයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන්නා වූ සේවාවන්ගේ ප්‍රධාන ලක්ෂණ හැකිතාක් දුරට පැහැදිලි කරනු ලැබේ. ඉන් පසුව මෙම සේවා ලබන අයගේ සහභාගිත්වයෙන් ඔවුන් ඒ සේවාවන් ලබන ප්‍රමාණයන් අනුව ඒ සේවාවන්ගේ සැපයුම විමර්ශනය කෙරේ. මේ සැපයුම්වල ප්‍රමාණය ද එහි සඵලත්වය ද අනුව පවත්නා වැදගත් ප්‍රාදේශීය විචලනයන් හුවා දැක්වෙන අයුරින් මේ විශ්ලේෂණය සැකසී ඇත.

38. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව. ළමා අපයෝජනය පිළිබඳ අත්පොත. කොළඹ, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව. කොළඹ, ගුණරත්න ඕෆ්සෙට් ලිමිටඩ්. පිටු 27.

### අන්තර්ගතය

ළමා අපයෝජනය පිළිබඳ ශාස්ත්‍රීය නිබන්ධනයක් නොවූවත් ප්‍රායෝගික වශයෙන් මෙම විෂය පිළිබඳ වගකීම දරන සැමට ප්‍රයෝජනවත් නිබන්ධනයකි. ළමා අපයෝජනය පිළිබඳ නීතිමය අංශය පමණක් නොව සමාජයීය සහ වෛද්‍යමය අංශ පිළිබඳ කරුණු දක්වා ඇත.

## 2.2.3 ළමයා සහ ප්‍රජා සංවර්ධන කටයුතු

39. ප්ලෑන් - ශ්‍රී ලංකා. පැය අටදාස් හත්සිය හැටක වතගොත (2000 ජුලි- 2001 ජුනි). මහනුවර, ප්ලෑන් - ශ්‍රී ලංකා. 2001. කොළඹ, ගුණරත්න ප්‍රින්ටර්ස්. පිටු 48.

### අන්තර්ගතය

"ප්ලෑන් ශ්‍රී ලංකා" ආයතනය ළමයා මූලික කරගන සංවර්ධන ක්‍රියාවලියේ නිරත වන ආයතනයකි. 2000 ජුලි සිට 2001 ජුනි දක්වා වසර තුළ රාමු හා කොටු බිඳගෙන ඉදිරියට අවුත් ළමයින්ගේ ප්‍රාර්ථනා හා බලාපොරොත්තු අවබෝධ කරගෙන ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නට ආයතනයට හැකි වූවා ද යන්න විමසා බැලීම මෙ මගින් සිදු කරයි.

"ප්ලෑන් ශ්‍රී ලංකා" ආයතනය 2001 වසරේ ප්‍රජාව සමග කළ වැඩ කොටස් සහ ප්‍රජාවට වැඩි සේවයක් සලසන්න හැඩ ගැසුණු ආකාරය ගැන සහ ඒ හා සම්බන්ධ වන සිද්ධි අධ්‍යයන කිහිපයක් මෙම පොතට ඇතුළත් වේ.

40. වෙත්තසිංහ, කුසලා. අමතක වුණාද? ඉර පායන්නේ අපේ හිනාවෙන්. මහනුවර. ප්ලෑන් ශ්‍රී ලංකා. 2000. කොළඹ, ගුණරත්න ප්‍රින්ටර්ස්. පිටු 88. ISBN 955-8456-00-4.

**අන්තර්ගතය**

ළමයෙක් ගැන හිතන්න. ගමක නැත්නම් නගරයක වුණත් කමක් නැහැ. ඔබ වාගේ ළමයෙක් පාසල් යනවා, ගෙදර එනවා, කුඹුරේ හේනේ වැඩවලට උදව් වෙනවා. සමහර විට අමතර ආදායමක් ගන්න පුළුවන් පොඩි රස්සාවක් කරනවත් ඇති. එහෙමත් නැත්නම් පාසලෙන් පස්සෙ අමතර පන්තියකට යනවා ඇති. අමතර පන්තියකට යන්න මුදල් හිඟකමින්, නැත්නම් දුර තියන පන්තියකට යන්න ගමන් පහසුකමක් නැති කමින් කණගාටු වෙමින් ඉන්නවා වෙන්නත් පුළුවන්. ළමයින්ගේ ජීවිත කෙළි සෙල්ලම්වලටත් පාඩම් පත පොතටත් සීමා නොවෙන නොයෙකුත් අත්දැකීම්වලින්. ප්‍රශ්නවලින් පිරිලා. ඒවා ළමයින්ගේ ම ප්‍රශ්න නොවෙයි. අපි කවුරුත් ජීවත් වන පරිසරයේ ප්‍රශ්න.

ඒ එක පැත්තක්. අනෙක් අතට අප ජීවත් වන පරිසරයේ නිතරම නොයෙකුත් සංවර්ධන කටයුතු කෙරෙනවා. ඒ අපේ - අපි කාගෙත් - ප්‍රශ්නවලට විසඳුමක් සොයන්නයි. සමහර සංවර්ධන කටයුතුවලින් ප්‍රශ්න විසඳෙනවා. සමහර ඒවායින් ප්‍රශ්න අවුල් වෙනවා. සංවර්ධන සැළසුම් ගම් පළාත්වලට ගෙනෙන ආයතනවල පිරිස් ඇවිත් ගමේ වැඩිහිටි අය එක්ක මේ ගැන කාරණා කටයුතු කතා කරනවා. බැරෑරුම් වචනවලින්. විශාල ඉලක්කම්වලින්.

ඒත්, ළමයින්ගේ අදහස් අහන්නේ කවුද? තමන්ගේ පරිසරයේ ප්‍රශ්න ගැන, දියුණු කරන්න පුළුවන් දේවල් ගැන අදහස් ළමයින්ටත් නැද්ද? ඇයි නැත්තේ. අහලා බලන්න එපායැ, මොන තරම් ගැලපෙන පැහැදිළි අදහස් ළමයින්ට තිබෙනවාද කියලා.

ඉතින් අපි ළමයින්ගෙන් ඇහුවා. තමන්ගේ පළාතට ගැලපෙන සංවර්ධනය ගැන අදහස්.

ඒ වැඩපිළිවෙල ඒ කියන්නේ සංවර්ධන අවශ්‍යතා ගැන ළමයින්ගේ අදහස් ගත් ආකාරය සහ එහි දී ළමයින්ගෙන් රටට ලැබුණු වටිනා පණිවිඩ ගැනත් ලියැවුණක් මේ පොත.

41. ජාරෙග්, එළිසෙබෙත්/ ජාරෙග්, පාල්, සංවාදය, ඔස්සේ දරුවන් වෙත ළංවීම. නෝර්වේ, සේව් ද චිල්ඩ්‍රන්. 1994. කොළඹ, ටයිපෝටෙක් 2000 (පුද්ගලික) සමාගම. පිටු 185. ISBN 0-333-59495-9.

**අන්තර්ගතය**

ඉතියෝපියාවේ සහන සේවාවේ නියැලී ලැබූ අත්දැකීම් ද පදනම් කරගෙන සම්පාදනය කර ඇති මෙම සැළසුම් මෙවලම, ප්‍රජා සංවර්ධන වැඩ ඔස්සේ දරුවන් වෙත ළඟා වීම සඳහා ඉවහල් කර ගත හැකි ය. ළමා සංවර්ධනයට සම්බන්ධ ප්‍රජා අනාවරණය, යන සංකල්පය මහද්වීප තුනක, සංවර්ධනය වෙමින් පවතින රටවල් ගණනාවකින් කතුවරුන් විසින් රැස් කර ගන්නා ලද අත්දැකීම්වල ප්‍රතිඵලයකි.

මෙම සංකල්පයට පදනම් වන්නේ වැඩිහිටියන් සහ ළමයින් සමග කරනු ලබන සංවාදය ඔස්සේ අදාල ප්‍රජාව පිළිබඳව දැනුම ලබා ගැනීමයි. සංවර්ධන වැඩවල නිරත වුවන් සහ ප්‍රජා නියෝජිතයින් ඒ පිළිබඳව ලබා ගන්නා ගැඹුරු අවබෝධය ළමා කේන්ද්‍රීය ක්‍රියාකාරකම්වල පදනම විය හැකි ය. ඒ මගින් අසරණ තත්ත්වයට පත්ව සිටින දරුවන් වෙත ද යම් ආලෝකයක් වැටෙනු ඇත.

මෙහි අන්තර්ගතය මුල සිට අග දක්වා අනාවරණය කරනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට එකඟව පවත්වනු ලබන වැඩමුළුවල දී ළමයින්ට සහ ඔවුන්ගේ සංවර්ධනයට වැඩි බරක් දෙමින් කෙරෙන ප්‍රජා අනාවරණයකි.

ලොව පුරා සිටින දරුවන් සහ ඔවුනට රැකවරණය සලසන්නන්ට සමීප වීමේ උත්සාහයක යෙදී සිටින සංවර්ධන වැඩවල නියැලී සිටින්නන්ට සහ රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයන්ට මෙය ඉතා වටිනා කෘතියක් වනු ඇත.

## 2.3 අවතැන්වන ජනතාව

### 2.3.1 සංවර්ධන වැඩසටහන් නිසා අවතැන් වීම

42. කුරුප්පු, සාංජනා/ ගනේපොල, වරුණි. කාගේ අයිතියද? සංවර්ධන ප්‍රේරිත විස්ථාපනය සාංජනා කුරුප්පු සහ වරුණි ගනේපොල. කොළඹ, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) 2005. හෝමාගම, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 34. ISBN: 955-1040-26-0. ISSN: 1391-9946.

**අන්තර්ගතය**

සංවර්ධනයට අදාළ මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගුන විස්ථාපනයන් පිළිබඳ සමස්තාවලෝකනයක් මෙම පොත මගින් ඉදිරිපත්

කෙරේ. එ මගින් පළමුව කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව විමසා බැලෙන අතර පසුව එහි මුලික අවධානය දැනට ක්‍රියාත්මකව පවත්නා ගමනාගමනයට අදාළ මැදිහත්වීම් දෙකක් වන කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට සහ දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියට යොමු කර ඇත. ඉන් අනතුරුව පරිමාණය, නැවත පදිංචි කරවීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වැනි රාජ්‍ය ක්‍රියා මාර්ග, නැවත පදිංචි කරවීම පිළිබඳ ජාතික න්‍යාය පත්‍රය වැනි ආයතනික යාන්ත්‍රණයන්, හවුල්කාර පිරිස් සමග පවත්නා සාකච්ඡා වැනි ක්‍රියාවලියන්, ජනතා දැනුවත්භාවය ඉහළ නැංවීම, ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම, ජනතා සහභාගිත්වය, ක්‍රියාවාදය සහ ප්‍රතිචාරය යන අංශවලට අදාළව එකී ව්‍යාපෘති දෙකෙහි සංවර්ධන ප්‍රේරිත විස්ථාපනයන් විමසා බැලේ.

### 2.3.2 යුද්ධය/ අරගල නිසා අවතැන් වීම

43. ජාතික ධීවර සහයෝගීතාවය. උතුරේ ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කර ගැනීමට වහා ඉඩ සලසමු. මීගමුව, ජාතික ධීවර සහයෝගීතාවය. 2004. මීගමුව, සමගි ප්‍රින්ට්ස්. පිටු 10.

#### අන්තර්ගතය

අධි ආරක්ෂිත කලාප හා බිම් බෝම්බ හමුවේ දුක් විඳින උතුරේ අවතැන් වූ ජනතාව සහ සරණාගත කඳවුරුවල දුක් විඳින ජනතාව විඳින දුක් ගැහැටවලින් බිඳක් මෙම කෘතිය තුළ සඳහන් කර ඇත. උතුරේ ජනතාවගේ නිවාස සහ භූමිය අධි ආරක්ෂිත කලාප නමින් වෙන් කර ඇති බැවින් ඔවුන්ට තම භූමිය තුළට ඇතුළු වීමට අවසරයක් නොමැත. එම නිසා ඔවුන් වසර ගණනාවක් තිස්සේ සරණාගත කඳවුරුවලට සීමා වී තම ජීවිතය ගෙන යනු ලබයි.

මෙම කෘතිය තුළින් සරණාගතයින් ලෙස විඳින දුක් ගැහැට සහ ඔවුන්ට තම ගම්බිම් බලා යාමට අවසරය ලබා දෙන ලෙස රජයෙන් ඉල්ලීම් කර ඇත.

එයට අමතරව, යුද්ධය නිසා විසි දහසකට අධික කාන්තාවන් වැන්දඹු බවට පත්ව ඇත. ඔවුන්ට ජීවත් වීම සඳහා රජය විසින් සලසන ක්‍රියා මාර්ගය කුමක්ද? එසේම දෙමාපියන් දෙදෙනාම හෝ එක් අයෙකු අහිමි වුණු දරුවන් කොපමණද? ඔවුන්ගේ අධ්‍යාපනය? වැනි උතුරේ අවතැන්වුණු ජනතාවට මුහුණ දීමට සිදුව ඇති දහසකුත් එකක් ගැටළු නිරාකරණය කරන ලෙස රජය වෙත කරන ඉල්ලීම් මෙම කෘතියට ඇතුළත් ය.

යාපනය දිස්ත්‍රික්කයේ අධි ආරක්ෂිත කලාප පිළිබඳ සමාජ සංක්ෂිප්ත සටහනක් සහ සිතියමක් මෙම කෘතියට අඩංගු වේ.

44. මානව හිමිකම් සඳහා වූ විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය). තල් අරඹ යට /මානව හිමිකම් සඳහා වූ විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය). කොළඹ, යුක්තිය ප්‍රකාශකයෝ. 1994. පිටු 194. ISSN: 955-9278-00-2.

### අන්තර්ගතය

ප්‍රතිපත්ති හෝ මිනිස් සාරධර්මවලින් තොර දේශපාලනයක් රට පුරා විහිදෙමින් පවතී. උතුරු නැගෙනහිර ප්‍රදේශවල තුවක්කුවල සෙවනැලි යටතේ මිනිස්සු සිහි විකල් වී ජීවත් වෙති. කුමන හෝ දිසාවකින් මරණය තමන් වැළඳ ගනීවිදැයි යන බියෙන් බලාපොරොත්තු රහිතව සිටිති. මිනිස් ජීවිත සහ මිනී කඳන් හුදෙක් ප්‍රචාරක භාණ්ඩ බවට පත් වී ඇති මෙවැනි පරිසරයක, යාපනයේ මානව අයිතිවාසිකම් සඳහා වූ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය උතුරේ සිදුවන මානව අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ සිදුවීම්, ඊට අදාළ සමාජ දේශපාලන සහ සාමාන්‍ය මිනිස් සබඳතා ගැන මෙම කෘතිය තුළින් ප්‍රකාශයට පත් කර ඇත.

45. ජනවාර්ගික අධ්‍යයනයන් සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය (ICES). ස්වාධීන විමර්ශන කමිටු වාර්තාව, ගාල්ලේ ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා 1995 ජූනි 02, කොළඹ, ජනවාර්ගික අධ්‍යයනයන් සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය. 1995. පිටු 33.

### අන්තර්ගතය

1995 ජූනි 02 දින ගාල්ල නගරයේ කඩ සාප්පු 28කට පහර දී ගිනි තබන ලදී. ප්‍රහාරයන් එල්ල කරනු ලැබූ කඩ සාප්පු ද ගින්නෙන් විනාශ වූ ඒවායින් වැඩි කොටසක් ද අයත් වූයේ දමිළ ජනතාවටයි. ගාල්ලේ ප්‍රහාරයන්ගේ බලපෑමට ලක් වූ පුද්ගලයින් සමග සහ අදාළ ප්‍රදේශයේ වගකිව යුතු නිලධාරීන් සමග කළ සාකච්ඡාවලින් මෙම වාර්තාව සමන්විත වේ.

46. සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය. ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් පොදු සමාව. කොළඹ, සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය. 2004. කොළඹ, ෆස්ට් ඉම්ප්‍රෙෂන්ස් (පුද්:) සමාගම. පිටු 10.

### අන්තර්ගතය

1983 ජූලි මාසය තුළ දී ද්‍රවිඩ ජනතාවට විරුද්ධව ක්‍රියාත්මක වූ ජනවාර්ගික ගැටුම ශ්‍රී ලංකාවට ඉතා විනාශකාරී ප්‍රතිඵල ගෙන දුන් ඛේදවාචකයකි. මෙම සිදුවීම හේතුවෙන්,

ඊට අදාළ කාලවකවානුවේ දී හා ඉන්පසුවත් ඒ මගින් සිදු වූ හානි අති බිහිසුණු ඒවා ය. ජීවිත හානි සහ දේපළ හානි ඒ අතර මුල්තැන ගත් අතර, මෙයට පෙර කිසිදු දිනයක එවැනි දරුණු සිදුවීම් මෙරට සිදු වී නැත.

1981 සිට 1984 දක්වා වු කාලය තුළ සිදු වූ වාර්ගික ගැටුම් හා ඒ හා සම්බන්ධයෙන් ඇති වූ විනාශකාරී සිද්ධීන් ගැන පැහැදිළිව, තත්ත්වාකාරයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට ජනාධිපතිනිය විසින් ත්‍රිපුද්ගල සත්‍ය ගවේෂණාත්මක කොමිසමක් 2001 වසරේ දී පත් කරනු ලැබී ය. එම කොමිසම මගින් හඳුනාගෙන, නිර්දේශ කරන ලද පුද්ගලයන්ට වන්දි ප්‍රදානය සිදු විය. 1983 කළු ජූලියේ 21 වෙනි සංවත්සරය වෙනුවෙන් 2004-07-23 දින කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවති වන්දි ප්‍රදානයේ දී එවකට ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග පැවැත් වු දේශනය මෙම කෘතියට අඩංගු වේ.

47. ඩයස්, විජේ. වර්ගවාදී යුද්ධයට 25 වසරක්. කොළඹ, කම්කරු මාවත ප්‍රකාශකයෝ. 2000. කොළඹ, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්. පිටු 192.
ISSN: 955-9123-60-2.

### අන්තර්ගතය

මෙම කෘතියේ සඳහන් කරුණු, 1997 වසරේ කම්කරු මාවත පුවත් පතෙහි ලිපි මාලාවක් ලෙස පල වූවකි. එවක වන විට 25 අවුරුද්දක් තිස්සේ සූදානම් කෙරුණු, දියත් කෙරුණු හා උග්‍ර කෙරුණු දෙමළ විරෝධී වර්ගවාදී යුද්ධයේ තතු පැහැදිලි කිරීම මෙම ලිපි මාලාවේ අරමුණ විය. මෙම කෘතියට ඇතුළු වන්නේ යුද්ධයේ මුල් වසර 15 තුළ එනම් 1987 දක්වා සිදුවූ වර්ධනයන් පිළිබඳ විමර්ශනයයි.

48. සාමිනාදන්, විමල්. ජනවාර්ගික ප්‍රශ්නය සහ යුද්ධයඃ දෙමළ නවකතාවේ පිළිබිඹුව. කොළඹ, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ. 2002. නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්. පිටු 190.
ISSN: 955-20-5365-X.

### අන්තර්ගතය

දෙමළ නවකතා තුළ ජන වාර්ගික ප්‍රශ්නය සහ යුද්ධය පිළිබිඹු වන ආකාරය පිළිබඳව විමසීමක යෙදීම මෙම කෘතියේ අරමුණයි. එබැවින් මෙය දෙමළ නවකතාවත්, යුද්ධය සහ ජන වාර්ගික ප්‍රශ්නය කේන්ද්‍ර කරගත් කියවීමකට ලක් කිරීමක් ලෙස සඳහන් කළ යුතු ය.

මක් නිසාද යත්, අදාල නවකතාව සතුව පවතින සාහිත්‍යමය ලක්ෂණ පිළිබඳව හෝ කලාත්මක අගය පිළිබඳව හෝ මෙහි දී අවධානය යොමු නොකරන බැවිනි. යුද්ධය සහ ජන වාර්ගික ප්‍රශ්නයත් ඒ ආශ්‍රිත සිදුවීම් පිළිබඳවත් දෙමළ සමාජයේ පවතින බහුවිධ දෘෂ්ටීන්, ප්‍රවණතා සහ මතවාදයන් පිළිබඳව යම් අවබෝධයක් සිංහල භාෂක සමාජයට ලබා දීමත්, ඒ තුළින් දෙමළ සමාජයේ මෙතෙක් අනාවරණය නොවූ ප්‍රදේශයන් කෙරෙහි ප්‍රබල ආලෝක ධාරාවක් එල්ල කිරීමක් මෙම කෘතිය තුළින් සිදු කෙරෙයි. එමෙන් ම අසල්වැසියාගේ කැටපතේ සටහන් වී ඇති තම පිළිබිඹුව පිළිබඳව ද සිංහල භාෂක සමාජයට මෙ මගින් අවබෝධයක් ලැබෙනු ඇත. මෙහි සඳහන් වන ඒ ඒ විෂයන් පිළිබඳ කරුණු සඳහන් කිරීමේ දී මූලාශ්‍ර වශයෙන් හෝ උපුටා දැක්වීම් වශයෙන් හෝ කරුණු ඉදිරිපත් කළ හැකි ශාස්ත්‍රීය හෝ වෙනත් පොත් පත් සහ ප්‍රකාශන කොතෙක් තිබුණ ද, ඒවා භාවිතා නොකර නවකතා ආශ්‍රයෙන් ම පමණක් අදාළ කරුණු දැක්වීම සිදු කරන ලද්දේ මෙහි දී හුදු නවකතාකරුවන්ගේ දෘෂ්ටීන්, මතවාදයන් පමණක් අඩංගු විය යුතුය යන අදහසිනි.

ජනවාර්ගික ප්‍රශ්නය යුද්ධයක් බවට පත් කළ පශ්චාත්-යටත් විජිත රාජ්‍ය ක්‍රියා මාර්ග, ජන වාර්ගික ප්‍රශ්නය සහ යුද්ධය ආශ්‍රිත දේශපාලන ව්‍යාපෘති, යුද්ධයෙන් පරිපීඩිත දමිළ සමාජයඃ යුද්ධය සහ ජන වාර්ගික ප්‍රශ්නය ආශ්‍රිත දෙමළ නවකතාවේ පිළිබිඹුව සහ ජනවාර්ගික ප්‍රශ්නය සහ යුද්ධය ආශ්‍රිත දෙමළ නවකතාවේ නිරූපිත සිංහල සමාජය යන මාතෘකා මෙම කෘතිය ඔස්සේ සාකච්ඡාවට බඳුන් කර ඇත.

49. නේසයියා, දේවනේසන්. සුළුතර කොටස්වල අයිතිවාසිකම් සහ සාම ක්‍රියාවලිය. කොළඹ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම. කොළඹ, යුනි ආට්ස් (පුද්ඃ) සමාගම. පිටු 28. ISSN: 955-582-100-3.

**අන්තර්ගතය**

සුළුතර කොටස් යනු ජනවාර්ගික වශයෙන් පමණක් නොවන අතර, විවිධ දේශපාලන මත ප්‍රකාශ කරන දේශපාලන පක්ෂ ද එයට ඇතුළත් වෙයි. සියළු වර්ගවල සුළුතර කොටස්වලට අයිතිවාසිකම් වැදගත් ය. දිවයිනේ සෑම කොටසක ම පූර්ණ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස නැවත ස්ථාපනය කරන තුරු සමානාත්මතාවය ඇති වන්නේ නැත.

දෙමළ ජනයාට විශේෂයෙන් බලපා ඇති රටක් නැති කම වූ කලී මානව අයිතිවාසිකම් පූර්ණ වශයෙන් අහිමි කිරීමක් වන අතර එය ඉවත් කළ යුතු ය. මානව අයිතිවාසිකම් බෙදා වෙන් කළ නොහැකි අතර ඒවා සාමයෙන්

සහ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම්වලින් සහ නන්වැදෑරුම් නිදහසෙන් වෙන් කළ නොහැක. මේවා ජනතාවගෙන් කිසියම් කොටසකට අහිමි කළහොත් සියළු දෙනාටම එයින් බලපෑම් ඇති වෙයි. උතුරු නැගෙනහිර සිටින හෝ එහි යන කිසිවෙකුටත් එහි සිදු වී තිබෙන ප්‍රබල වෙනස්කම් නොදැක සිටීමට නොපුළුවන.

මෙම කෘතිය තුළින් සාකච්ඡා වන්නේ උතුරු නැගෙනහිර දෙපළාතේ සිදු වී තිබෙන මානව අයිතිවාසිකම් කඩවීම පිළිබඳ සහ විශේෂයෙන් යුද්ධය, සාමය උදා කරගැනීම සහ දෙමළ ජනතාවට සිදු වී ඇති අසාධාරණයන් පිළිබඳවයි.

50. පඤ්ඤාසීහ, මඩිහේ මහානායක ස්වාමීන් වහන්සේ. දමිළයන්ට අසාධාරණයක් කර නැත. කොළඹ, ධර්ම විජය සමාගම. 1979. කොළඹ, ප්‍රසාද් මුද්‍රණාලය. පිටු 69.

### අන්තර්ගතය

සිංහලයන් සහ උතුරු නැගෙනහිර වාසය කරන දමිළ ජනයා එකම ජාතියකට අයත් වෙති. සිංහල සහ දෙමළ යනු ජාති දෙකක් නොව එකම ජාතිය කි. වර්ගවාදී දේශපාලන පක්ෂ විසින් සිංහල සහ දෙමළ යනු ජාති දෙකක් බව රටට ඒත්තු ගන්වා ජාතීන් අතර මිත්‍රත්වය දෙකඩ කර භේදභින්න කරවීම සිදු කර ඇත. මෙම කුඩා ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන්නේ සත්‍ය ඉස්මතු කර බුද්ධිමත් සිංහල සහ ද්‍රවිඩ ජනතාවට ඇති තතු වටහා දීම පිණිසයි.

51. නිශාන්ත එච්. ඒ. ඒ. දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාව සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් (1983- 2001). 2004. පිටු 211.

### අන්තර්ගතය

සමස්තයක් ලෙස දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය LTTE සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාවට ප්‍රතිචාර ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවේ ක්‍රියා මාර්ගයන් මිශ්‍ර ප්‍රතිඵල ලැබූ බව කිව හැකි ය. එනම් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය මුළුමනින් ම සාර්ථක හෝ අසාර්ථක නොවූ බවයි. ශ්‍රී ලංකා ආණ්ඩුවට මුළුමනින් ම සාර්ථක ප්‍රතිචාරයක් ලැබිය නොහැකි වූයේ LTTE සංවිධානය විසින් පවත්වා ගෙන යන අරගලයට උතුරු සහ නැගෙනහිර ජීවත් වන දෙමළ ජනයාගේ සහ සිය රටින් බාහිර වශයෙන් ජීවත් වන දෙමළ ප්‍රජාවේ සහාය හිමි වීමත් යුද්ධමය සහ යුද්ධමය නොවන විධි ක්‍රම ඔස්සේ සාර්ථක ප්‍රතිචාරයක් දැක්වීමට අසමත් වූ නිසා ය.

1983-2001 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාව සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකට ලක් කර ඇත. මෙම අධ්‍යයනය අවසන් කරන අවස්ථාව වන විට LTTE සංවිධානය සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර මාස 22ක සටන් විරාමයක් සහ වට කිහිපයකින් සමන්විත වුණු සාකච්ඡා ක්‍රියාදාමයක් ද ඇරඹී තිබුණු බැවින් 2002 සහ 2003 වර්ෂවල සිදු වූ වර්ධනයන් ද එයට ඇතුළු කර ඇත.

52. ශ්‍රී ලංකා නීතිඥ සංගමය. අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා නීති අත්පොත. කොළඹ, ශ්‍රී ලංකා නීතිඥ සංගමය. 2002. කොළඹ, ග්ලොබ් ප්‍රින්ටින් වර්ක්ස්. පිටු 46.

### අන්තර්ගතය

ශ්‍රී ලාංකික ජනගහනයෙන් 800,000කට ආසන්න පිරිසක් අභ්‍යන්තරිකව අවතැන් වී ඇති බව ගණන් බලා ඇති අතර ඔවුන්ගෙන් සමහරෙක් දශකයක පමණ කාලයක් තිස්සේ සුබ සාධන මධ්‍යස්ථානවල වෙසෙති. අවතැන් වීම හේතු කොටගෙන මොවුහු උප්පැන්න සහතික, හැඳුනුම්පත්, ගමන් අවසර පත්, අධ්‍යාපන සහතික ආදිය ලබා ගැනීමේ දී නීතිමය ගැටළුවලට මුහුණ දෙති. ලියකියවිලි නොමැති වීම ඇතැම් විට අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම්වලට ද හේතු වේ. මෙම පොත් පිංච අවතැන්වූවන්ට අවශ්‍ය වන ලියකියවිලි සකස් කරගන්නා ආකාරය පිළිබඳ මූලික මග පෙන්වීමක් සපයයි.

53. Conciliation Resources. සාමය පිළිබඳ ජාත්‍යන්තර විවරණයඃ සම්මුතියඃ ශ්‍රී ලංකාවේ යුද්ධය සහ සාකච්ඡා. ලන්ඩන්, Conciliation Resources. 1998. කොළඹ, ගුණරත්න ඕෆ්සෙට් ලිමිටඩ්. පිටු 98.

### අන්තර්ගතය

නිදහසේ සිට ගෙවී ගිය වසර පනහ තුළ, ශ්‍රී ලංකාව ජනවාර්ගික/ ජාතික අරගලයකින් ඉරිතලා ගිය අතර එය 1983 දී සංග්‍රාමයක් බවට පත් විය. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දමිළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය විසින් නායකත්වය දෙනු ලබන සන්නද්ධ හමුදා බලඇණි දෙකක් සටන් වැදෙන මෙම සංග්‍රාමය විශේෂයෙන් ම, දමිළ බහුතරයක් වාසය කරන උතුරු නැගෙනහිර ඇතුළු ශ්‍රී ලාංකිකයන් දස ලක්ෂ ගණනකගේ ජීවිත අනතුරෙහි හෙළා ඇත. මෙම කෘතියේ අඩංගු ලිපි තුළින් එම සන්නද්ධ අරගලය පිළිබඳව සහ එයින් පීඩාවට පත් ජනතාව පිළිබඳ තොරතුරු අනාවරණය කරනු ලබයි. කෘතියේ අඩංගු ලිපි වන්නේ. ඓතිහාසික අන්තර්ගතය, වෙහෙසකර එකගතාවඃ

ශ්‍රී ලංකාවේ යුද්ධය සහ සාමය උදෙසා ආණ්ඩුවේ උපාය ක්‍රම 1994- 1998, අසීරු කාල පරිච්ඡේදයඃ ශ්‍රී ලංකාවේ සන්නද්ධ අරගලය විසඳීම උදෙසා වන ව්‍යවස්ථාමය ප්‍රයත්නය, ස්වයං නිශ්චය- ලංකා දමිළ දසුනක්, ජනප්‍රිය බුදු දහම, දේශපාලනය සහ ජනවාර්ගික ගැටළුව, දමිළ අනන්‍යතාවය හා ප්‍රාර්ථනා සහ ජනවාර්ගික අර්බුදයේ ප්‍රධාන භූමිකා යනුවෙන් නම් කර ඇත.

54. ගුණවර්ධන, චන්ද්‍රසේකර සිරිල්. ලජ්ජා. නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ. 2003. කොළඹ, සමයවර්ධන ප්‍රින්ටර්ස්. පිටු 200. ISBN 955-573-260-4.

**අන්තර්ගතය**

තස්ලීමා නස්රීන් නැමැති බංග්ලාදේශ ලේඛිකාව විසින් බෙංගාලි බසින් ලියන ලද ඬලජ්ජාඬ නැමැති ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයයි.

1992 දෙසැම්බර් හය වැනි දින අයෝධ්‍යාවේ "බාබ්රි මස්ජිද්" මුස්ලිම් දේවස්ථානය විනාශ කිරීමේ සිද්ධිය සමග ඬලජ්ජාඬ ලිවීම කතුවරිය ආරම්භ කර ඇත. බංග්ලාදේශයේ සුළු ජාතික ආගමික කණ්ඩායමක් වන හින්දූන්ට, මුස්ලිම්වරුන් විසින් තදබල ලෙස හිරිහැර කිරීම මුල්කොට ගෙන මෙම කෘතිය රචනා කර ඇත. 1993 දී මෙම ග්‍රන්ථය බංග්ලාදේශයේ දී මුද්‍රණය කර ඇත. එයින් මාස 05කට පසු මෙම කෘතිය එරට තහනම් කළ අතර කතුවරියට ජීවිතාරක්ෂාව පතා මව් රටෙන් ඉවත් වන්නට සිදු විය.

කතුවරියගේ මනසින් ගොඩනගාගත් කතා වස්තුවක් ලෙස මෙය ඉදිරිපත් කරන අතර, මෙහි චරිත කිසි ලෙසකින් දැනට ජීවත් වන හෝ මියගිය අය වෙත සබඳ කමක් නැත. එහෙත් මෙම කෘතිය සිද්ධියක් මධුර මනෝහර ආකාරයෙන් විස්තර කරන ප්‍රබන්ධ නවකතාවක් නොව, සත්‍ය ඓතිහාසික සිද්ධීන් හා සංඛ්‍යාලේඛන ගණනාවක්ම වගකීමකින් ඉදිරිපත් කර ඇති වාර්තාමය නවකතාවකි. ඬඑකෝත්තාඬ, ඬඅස්කර් බාගෝස්ඬ, ඬහෝරර් බාගෝස්ඬ සහ ඬග්ලිනීඬ (අවමානය) යන මූලාශ්‍රවලින් ද බංග්ලාදේශයේ ජාතිවාදී හෙළා දැකීම් පිළිබඳ කරුණු සඳහන් ලේඛන සහ පර්ෂද වාර්තා යන ලිපි ලේඛනවලින් මෙම කෘතිය සඳහා කරුණු ලබා ගෙන ඇත. බොහෝ ස්ථාන නාම, ප්‍රදේශ නාම සහ සිද්ධීන් එලෙසින් ම දක්වා ඇත.

ආගමික මූලධර්ම වාදය නැමැති වසංගතය බංග්ලාදේශයට පමණක් සීමා වුවක් නොවේ.

ශ්‍රී ලංකාවේ ආගමික අන්තවාදීන් මෙම කෘතිය ලංකාව තුළ ද තහනම් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීය. "ඬලජ්ජාඬ" බංග්ලාදේශයේ හින්දූන් මුහුණ දෙන

ගැටළුවක් පමණක් නොව අර්ථ විරහිත දාමරික කම්වලට ගොදුරු වන කාගේත් කතාවක් ලෙස පිළිගත යුතුය.

### 2.3.3 ස්වාභාවික ආපදා නිසා අවතැන් වීම

55. මහජන සැළසුම් කොමිසම. සුනාමියෙන් පසු යළි ගොඩනැගීම සඳහා වු මහජන සැළසුම් කොමිසම් වාර්තාව 2006. කොළඹ, මහජන සැළසුම් කොමිසම. 2006. කොළඹ, සදීපා ප්‍රින්ට් හවුස්. පිටු 166.
    ISBN 955-1439-01-5.

### අන්තර්ගතය

ජීවිත 40,000ක් බිලි ගත් 500,000ක ජනයා අවතැන් කළ, ඔවුන්ගේ ජීවන මාර්ග සහ දේපළ විනාශ කළ සුනාමිය ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලත ම ස්වාභාවික ව්‍යසනය බව පුන පුනා කිව යුතු නැත. මෙහි දී විනාශයට පත් ජීවන මාර්ග හා දේපළ යළි ගොඩනැගීම අරභයා විවිධ ජන කොටස් සහ සංවිධාන ලබා දුන් සහයෝගය හා සහභාගිත්වය අතිමහත් විය. විපතට පත් ප්‍රදේශ පුනරුත්ථාපනය සඳහා ආණ්ඩුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය තීරණාත්මක ප්‍රශ්න මතු කර තිබේ. මෙම ක්‍රියාවලිය ශ්‍රී ලංකාව තුළ ද, ඉන් පිටත ද පැවති සමුළුවල දී පුළුල් ලෙස අධ්‍යයනය කර සහ සාකච්ඡා කර තිබේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ ජනතා අරගල සහ විරෝධතා ක්‍රියාකාරීත්වයන් ගණනාවක දී මෙම ප්‍රශ්න මතු කොට ඇත. මහජන සංවිධාන විසින් යළි ගොඩනැගීමේ ප්‍රයත්නයන්ට ත්‍යාගශීලීව දායක වු විවිධ රටවලට මෙම ප්‍රශ්නය පිළිබඳ තොරතුරු බෙදා හැර තිබේ. මෙම ප්‍රශ්නය දැන් එක්සත් රාජධානිය, බෙල්ජියම, ජර්මනිය, නෙදර්ලන්තය, කැනඩාව සහ නවසීලන්තය වැනි රටවල් ගණනාවක සාකච්ඡාවට ගෙන ඇති අතර කැනඩාව වැනි රටවල සුනාමි විපතට පත් වුවන්ට යුක්තිය සඳහා වන උද්ඝෝෂණ බිහි වී ඇත.

සුනාමි ප්‍රතිසංස්කරණ සඳහා මහජන සැළසුම් වාර්තාව තුළ පුනරුත්ථාපන හා යළි ගොඩනැගීමේ දී පිළිපැදිය යුතු මූලික ප්‍රතිපත්ති, දීගු කාලීන ගොඩනැගීම්, ආර්ථික ක්‍රියාකාරකම්, නිවාස සහ ඉඩම් ලබා දීම සහ සේවාවන් පිළිබඳ සහ මහජන කරුණු විමසීමේ වාර්තා, ජාතික ධීවර සහයෝගීතාවයේ සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වෙරළාසන්න ප්‍රජාවගේ සහ ධීවර කර්මාන්තයේ ප්‍රතිසංස්කරණය සඳහා වු යෝජනාවලිය ඇතුළත් වාර්තාව, යාපනය රාජ්‍ය නොවන සංවිධාන එකතුවේ ගැටුම් පීඩිත ප්‍රදේශ වල සුනාමි ප්‍රතිසංස්කරණය සහ පුනරුත්ථාපනය පිළිබඳ වාර්තාව සහ සුනාමියෙන් පසු ජනතාවගේ ජීවන තත්ත්වය සොයා බැලීමේ සංවිධාන කිහිපයක වාර්තා අඩංගු වේ.

56. මානව හිමිකම් කොමිසම් සභාවේ ආපදා සහන අධීක්ෂණ ඒකකය සහ ප්‍රජා ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොළඹ විශ්ව විද්‍යාලය. ශ්‍රී ලංකාවේ පශ්චාත් සුනාමි සහන, ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් ජනතා අදහස් විමසීම පිළිබඳ වාර්තාව (2005 ජුලි-සැප්තැම්බර්). කොළඹ, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන. 2005. පිටු 320.

අන්තර්ගතය

ශ්‍රී ලංකාව තුළ සුනාමියේ බලපෑමට ලක් වුණු සියළුම ප්‍රදේශ අධ්‍යයනයට ඇතුළත් කර ඇත. සුනාමි ප්‍රදේශ යථා තත්ත්වට පත් කිරීමේ ක්‍රියාවලියේ දී ආපදාවට මුහුණ දුන් ජනතා සහභාගිත්වය නොමැති වීම යන කරුණු සැලකිය යුතු අඩුපාඩුවක් ලෙස හෙළි විය. එම නිසා ආපදාවට ලක් වු ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා එම ප්‍රදේශවල ග්‍රාම නිලධාරී, දිසාපති සහ ප්‍රජාව සමග සිදු කළ අදහස් විමසීම්වලින් හෙළි වන කරුණු ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත ලබා දීම මෙම වාර්තාවේ අරමුණයි. ආපදා ප්‍රදේශවල පවතින ගැටළු සහ එහි වර්තමාන තත්ත්වය සහ ඒ පිළිබඳ යෝජනා ඉදිරිපත් කර ඇත.

57. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS). ශ්‍රී ලංකාවේ පශ්චාත් සුනාමි ජීවනෝපායයන්, පෙරට වඩා හොඳින් යළි ගොඩනගමු?. කොළඹ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය. 2006. කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 74. ISBN 955-8708-44-5.

අන්තර්ගතය

දිළිඳුකම පිටුදැකීම සහ ආපදා කළමනාකරණය, සුනාමියෙන් පසු ජීවනෝපායයන් යළි පණ ගැන්වීමට පවත්නා වැඩසටහන්වල හිඩැස් හඳුනා ගැනීම සහ ප්‍රජා මට්ටමින් ජීවනෝපාය සංවර්ධනය කර ගැනීම පිණිස සුනාමි ආධාර බෙදා දීම පිළිබඳ තොරතුරු අඩංගු වේ.

58. වික්‍රමරත්න, ධර්මන්. ආපදා වාර්තාකරණයඃ මාධ්‍යවේදී පුහුණු අත්පොත. ශ්‍රී ජයවර්ධනපුරඃ ශ්‍රී ලංකා පාරිසරික ජනමාධ්‍යවේදී පර්ෂදය (SLEJF). 2005. කෝට්ටේ, සිගේරා එන්ටර්ප්‍රයිසස්. පිටු 104. ISBN 955- 9161-46- 6.

අන්තර්ගතය

පරිසර අයිතිවාසිකම් සහ ආපදාවන්ට ගොදුරු වු ජනතාවගේ අයිතිවාසිකම් ලබා ගැනීමට හැකියාව ලැබෙනුයේ මාධ්‍යවේදීන් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම සහ යහපත් සන්නිවේදනය සඳහා මාධ්‍ය භාවිතා කළහොත් පමණි.

පාරිසරික අයිතිවාසිකම්වලට ගරු කරමින් යථාර්ථවාදී, කාලීන සහ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට ස්වාභාවික ආපදා වාර්තාකරණයේ නිරත වන මාධ්‍යවේදීන් කටුතු කරන්නේ කෙසේද? යන්න සහ ඒ සඳහා අවස්ථාව ලබා ගන්නේ කෙසේද? යන්න මෙම ග්‍රන්ථය මගින් පැහැදිළි කර දී ඇත. මාධ්‍ය ක්ෂේත්‍රයේ නියුතු සියළු පාර්ශ්වයන් වෙත ආපදා වාර්තාකරණය පිළිබඳ සංකල්පය හඳුන්වා දීම, සංවාදයක් ගොඩනැගීම, ක්‍රියාකාරී වීමට අවස්ථාව වැඩි වැඩියෙන් විවර කර දීම මෙම ග්‍රන්ථයේ ප්‍රධාන අරමුණකි.

ආපදා පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය සඳහා මෙම ග්‍රන්ථය මාහැඟි පිටුවහලක් වන අතර එය ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සැමට අත්පොතක් ද වනු ඇත.

## 2.4 ආබාධිත පුද්ගලයන්

59. මෙන්ඩිස්, පද්මිණී. ආබාධිතතාවයන් ඇති පුද්ගලයින්ගේ පුනරුත්ථාපනය-ප්‍රජාව තුළ සම අයිතිවාසිකම් ලබා දීම පිළිබඳ අත්පොත. කොළඹ, කාන්තා අභිවෘද්ධි හා සමාජ සුබ සාධන අමාත්‍යාංශය. 1981. කොළඹ, විජය නිෂ්පාදකයෝ. පිටු 568.

### අන්තර්ගතය

ආබාධිත පුද්ගලයන් හට කිසියම් අසාධාරණයක් සිදුවීමට ඇති සියළු ඉඩකඩ මග හැරවීමත්, ඔවුන්ගේ පූර්ණ හැකියාවන් අවබෝධ කර ගැනීමට මග පාදන වැඩසටහන් හඳුන්වා දීමත් මෙම අත්පොත මගින් බලාපොරොත්තු වී ඇත. සමානාත්මතාවයේ නාමයෙන් ජනතා අපේක්ෂාවන් හා සිතුම් පැතුම් අගය කරමින් ආබාධිත හා එසේ නොවන සෑම කෙනෙකුටම රටේ සංවර්ධනයට අත හිත දීමට මග සලසමින් කවුරුත් සමාන හැකියාවන් ඇතැයි සිතමු. එසේම ආබාධිතයන් වෙනුවෙන් ඉක්මනින් කළ යුතු අත්‍යවශ්‍ය කාර්යක් වන පුනරුත්ථාපන වැඩසටහන් දිරිගැන්වීම උදෙසා මෙම පොත සෑම අතින්ම මහෝපකාරී වනු ඇත.

60. හතරුසිංහ, ලයනල්. ශ්‍රී ලංකාවේ ආබාධිත දරුවන් සඳහා විශේෂ පාසල්. කතෘ. 1999. අතුරුගිරිය, සුසර ඇඩ්වටයිසින්. පිටු 148.
    ISBN 955-95152-4-1.

### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ ආබාධිත වූවන්ගේ තත්ත්වය, ආබාධිත බව සහ ඊට හේතු හා ආබාධ වැළැක්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. එසේ ම විශේෂ අධ්‍යාපනය

යනු කුමක්ද? යන්න පිළිබඳ සහ ශ්‍රී ලංකාවේ ආබාධිත පුද්ගලයන් සඳහා වන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු මෙම කෘතියට ඇතුළත් ය.

## 2.5 සංස්කෘතිය/ කුලය හෝ සමාජ වෙනස්කම් නිසා පීඩාවට පත්වීම

61. කරුණාරත්න, ඩේවිඩ්. එදා හෙළ දිව. කොළඹ, එම්. ඩී. ගුණසේන සහ සමාගම. 1959. පිටු 385.

### අන්තර්ගතය

ක්‍රි.ව. 1660 අප්‍රේල් මස 04 වැනි දින ලංකාවට ගොඩ බැස ඇති රොබට් නොක්ස් නම් ඉංග්‍රීසි ජාතික නැවියා, ලංකාවේ වාසය කළ විසි වසර තුළ ශ්‍රී ලංකාව හා එහි ජනතාවත්, ප්‍රජා පාලන ක්‍රමයත් සම්බන්ධයන් දැනගත් විස්තර හා ස්වකීය ජීවිත විත්තිය මෙම ග්‍රන්ථය තුළින් අනාවරණය කර ඇත. 1679 සැප්තැම්බර් මස ලංකාවේ සිර භාරයෙන් ගැලවී සිය රට පලා යන අතරතුර දී ඔහු මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විදේශීය වාර්තාකාරයෙකු විසින් කරන ලද දීර්ඝතම සහ විශිෂ්ඨතම විස්තරයක් ලෙස මෙම ග්‍රන්ථය හැඳින්විය හැක. පුරාතන ලංකාවේ සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, කෑම බීම, ගති ගුණ, ආගම ධර්මය හා භාෂාව ආදී විවිධ කරුණුත් විශේෂයෙන් කන්ද උඩරට ප්‍රජා පාලන ක්‍රම සම්බන්ධයෙන් අගනා කරුණු රැසක් අනාවරණය කරනු ලබයි.

එදා හෙළ දිව ග්‍රන්ථයේ 20 පරිච්ඡේදයේ සිංහලයන්ගේ කුල භේදය සහ ඒ හා සම්බන්ධව පැවැති රාජ්‍ය පාලන ක්‍රමය සහ සමාජ ක්‍රමය පිළිබඳ තොරතුරු අනාවරණය කරනු ලබයි.

62. සිල්වා, කාලිංග ටියුඩර්. කුලය, පංතිය සහ ලංකාවේ සමාජ ගැටුම්. බොරලැස්ගමුව, සී/ස (පෞද්) විසිදුණු. 2005. බොරලැස්ගමුව, සීදේවි ඕෆ්සෙට්. පිටු 177. ISBN 955-9170-76-7.

### අන්තර්ගතය

ලංකා සමාජයේ විවිධ ගැටළු සහ හැල හැප්පිලි බොහොමයක් සඳහා සමාජ අසමානතාව ඍජුව හෝ වක්‍රව බැඳි පවතී. අපරාධ හෝ වේවා, මතට ඇබ්බැහිය හෝ වේවා, තරුණ ප්‍රචණ්ඩත්වය හෝ වේවා, මහජන ආරක්ෂාවට ඇති තර්ජන හෝ වේවා බැලූ බැල්මට එකිනෙක හා අසම්බන්ධ වූ මෙම ගැටළු යා කරන එක් හුයක් අප සමාජයේ ඇත්නම්, එය සමාජ අසමානත්වය සහ සමාජ අසාධාරණත්වය හා බැඳුණු විෂයබද්ධ සහ මනෝමය තත්ත්වයන්

ලෙස හඳුනාගත හැකිය. ලංකා සමාජයට ආවේණික එම සමාජ අසමානතාවයන් හා සමාජ අසාධාරණයන්ගේ ස්වාභාවය පදනම සහ ප්‍රවණතා ගැඹුරින් විමසීම මෙම ශාස්ත්‍රීය කෘතියේ අරමුණයි.

63. එපිටවත්ත, සෙනෙවි. සමාජය කියවීම 2 (සංස්කෘතිය, ආගම, මානවවාදය, ජාතිකත්වය, දූප්පත්කම). මහරගම, සී/ස ස්ටැම්ෆර්ඩ් ලේක් (පෞද්ගලික) සමාගම. 2006. මහරගම, තරංජි ප්‍රින්ට්ස්. පිටු 209.
ISBN 955-113-60-6.

අන්තර්ගතය

මිනිසුන් මිනිසුන් සමග සමාන කිරීමටත්, එමෙන් ම මිනිසුන් මිනිසුන්ගෙන් බෙදා වෙන් කර ගැනීමටත් හේතු පාදක කරගෙන ඇත්තේ ස්ත්‍රී පුරුෂ බව, ඇති නැති බව, ජාතිය, ආගම, කුලය. සංස්කෘතිය, හා පවුල සම්බන්ධ ක්‍රියාවලියන් සහ ආකල්ප යනාදිය යි. ලෝකය සහ සමාජය යන සාධක පිළිබඳ යථා දර්ශනයන් ඇති කර ගැනීම සඳහා මෙම තේමා පිළිබඳව ගැඹුරින් සිතා බැලීම වර්තමාන සමාජයේ මූලික අවශ්‍යතාවයක් ලෙස පවතියි. සමාජය කියවීම සඳහා මුලින්ම තේරුම් ගත යුත්තේ සමාජ බලවේග, සමාජ ක්‍රියාවලි සහ සමාජ ඒකකයන් ය.

ජනවාර්ගික අර්බුදය, ආර්ථික අර්බුදය සමාජයේ පවතින අසහනකාරී බව සහ සංස්කෘතික අර්බුද නිතර පෙනෙන විටත්, ඇසෙන විටත්, දැනෙන විටත් සමාජය පිළිබඳ මෙවැනි විශ්ලේෂණයක් කිරීමේ අවශ්‍යතාවය ඇති වුණු බව කතුවරයාගේ අදහසයි. මෙම සාපකාරී බලවේග යම් තරමකට හෝ අප අතරින් ඉවත් කිරීම කළ හැක්කේ සමාජය කියවා බලා, තේරුම් ගැනීමෙන් පමණි. ඒ සඳහා මෙම කෘතිය හේතු පාදක වනු ඇත.

64. අමරසේකර, දයා. ශ්‍රී ලංකා සමාජය, සමාජ විද්‍යාත්මක විමසුමක්. වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ. 1988. දිවුලපිටිය, සරස්වතී මුද්‍රණ. පිටු 138. ISBN 955-553-011-4.

අන්තර්ගතය

මෙම කෘතිය ශ්‍රී ලංකා සමාජය පිළිබඳව කරනු ලැබූ සමාජ විද්‍යාත්මක අවලෝකනයක් ලෙස සැළකිය හැකිය. මෙම කෘතිය සැබැවින්ම අප ගැනම කරන සරල විවරණාත්මක හැඳින්වීමකි.

ශ්‍රී ලංකා සමාජයේ කුලය පිළිබඳ විමර්ශනයක්, නව ගොවි ජනපදවල සමාජ ගැටළු, සමාජ වෙනස්වීම සහ ශ්‍රී ලංකාවේ සමාජානුයෝජන රටා, ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය, ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න සහ ශ්‍රී ලංකාවේ දිළිඳුකම යන ක්ෂේත්‍ර ඔස්සේ මෙම කෘතියෙහි කරුණු සඳහන් වේ.

65. අයිවන්. වික්ටර්. නිදහස ජාතික ඒකාග්‍රතාව හා දේශපාලනයේ පවුල් පොරය. රත්මලාන, නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන පදනම. 1999. රත්මලාන, ප්‍රින්ට් ඉන්. පිටු 255.

### අන්තර්ගතය

මෙම කෘතියට මූලික දේශපාලන වැදගත්කමක් ඇති රචනා තුනක් ඇතුළත් ය. පළමු රචනයෙන් ජාතික ඒකාග්‍රතාව පිළිබඳ ගැටළුව ඉන්දියාවේ හා ලංකාවේ නිදහස් ව්‍යාපාර ආශ්‍රයෙන් සලකා බලන්නකි. පකිස්ථානය වශයෙන් රටෙන් කොටසක් වෙන් වීම වළක්වා ගැනීමට අසමත්වුවත් ඉන්දියාව වශයෙන් ඉතිරි වූ කොටසේ වර්ගය, ආගම, භාෂාව හා කුලය මත පැවැති බෙදීම් තුනී කරමින් ඒ බෙදීම් තුළ සිටි සියළු දෙනා එකතු කොට අභිනව ඉන්දියානු ජාතියක් ඇති කර දීමට ඉන්දියාවේ ජාතික නිදහස් අරගලය සමත් විය.

ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බලන විට, නිදහස දිනා ගැනීමට සමත් වූවත් ඉන්දියාවේ මෙන් වර්ගය, ආගම, භාෂාව හා කුලය මත පැවැති බෙදීම් තුනී කරමින් ඒ බෙදීම් තුළ සිටි සියළු දෙනා එකතු කොට අභිනව ශ්‍රී ලාංකික ජාතියක් තැනීමට ලංකාවේ ජාතික නිදහස් ව්‍යාපාරය අසමත් විය. ඉන්දියාවට වෙනස්ව එය ලංකාවේ එසේ වුණේ ඇයිද යන ප්‍රශ්නය පළමු රචනයෙන් සලකා බලා ඇත.

මෙහි එන දෙවන රචනයෙන් පැරණි වැඩවසම් ක්‍රමයෙන් ඉතිරි වී පවත්නා කුලය මත පදනම් වූ උස් පහත් බව ශ්‍රී ලංකාවේ දේශපාලනය කෙරෙහි බලපා ඇති ආකාරය සහ ශ්‍රී ලංකාවේ දේශපාලන ඒකාධිකාරය පවරා ගෙන සිටින ප්‍රධාන පවුල් සංගම් දෙකක් අතර එම උස් පහත් භේදය බලපා තිබෙන ආකාරයත් නැවත ඒ දෙපිරිසම කුල භේදය අහෝසි කිරීම පිණිස ඵලදායී කිසිවක් නොකොට සිය දේශපාලන බල ව්‍යාපෘති ඉදිරියට ගෙන යාම සඳහා කුල භේදය ප්‍රයෝජනයට ගනිමින් තිබෙන ආකාරයත් විග්‍රහ කෙරේ. තුන් වැනි රචනයේදී එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ දේශපාලන කාර්යභාරය පිළිබඳ අවංක ඇගයීමක් කිරීමට උත්සාහ දරා ඇත.

## 2.6 කම්කරුවන්/ වෘත්තිකයන් සහ ආදායම් උපයන්නන්

66. සරත්, ලයනල්. ශ්‍රී ලංකාවේ කම්කරු පංති අරගලය. (මෑත යුගයේ කතා පුවත). කොළඹ, ලංකා වෘත්තීය සමිති සම්මේලනය. කොළඹ, මහජන මුද්‍රණාලය. පිටු 172.

**අන්තර්ගතය**

1933 සිට 1945 දක්වා දක්වා කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ සිදු වුණු කම්කරු අරගල පිළිබඳ තොරතුරු අඩංගු වේ. එහෙත් කෘතියේ පිවිසුම සහ පාඨකයාගේ දැනුම වර්ධනය සඳහා 1893 සිට 1933 දක්වා කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ කම්කරු පංති අරගලය සහ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත. ඒ සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කුමාරි ජයවර්ධනගේ, ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, නම් පර්යේෂණ කෘතිය පාදක කරගෙන ඇත. එතුමියගේ නිබන්ධනයට ඇතුළත් නොවුණු ඇතැම් මූලාශ්‍රමය කරුණු ද එම සාරාංශයට ඇතුළත් කර ඇත. පොතේ අවසාන කොටස ලංකා කම්කරු සමිති සම්මේලනය සහ ලංකා කොමියුනිස්ට් පක්ෂය මගින් මෙහෙයවන ලද ප්‍රධාන කම්කරු අරගලවලට පමණක් සීමා කර ඇත.

67. ලියනගේ, ජයන්ත. පරිසර සංරක්ෂණය සහ ජනමාධ්‍ය (කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පරිසර දූෂණය සහ ජනමාධ්‍ය සමීක්ෂණය). කොළඹ, ජීවිතය සහ පරිසරය සුරැකීමේ සංවිධානය. 1991. පිටු 38.

**අන්තර්ගතය**

නිදහස් වෙළෙඳ කලාපය බිහි වීම නිසා කටුනායක ප්‍රදේශයේ සිදු වී තිබෙන පාරිසරික විනාශය සහ එම ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ දෛනික ජීවිතය පවත්වාගෙන යාමට එමගින් සිදු වූ බාධාවන් සහ හානිදායක තත්ත්වයන් මෙම ග්‍රන්ථය මගින් අනාවරණය කරයි. නිදහස් වෙළෙඳ කලාපය ආරම්භ කිරීමට පෙර සහ ආරම්භ කිරීමෙන් පසු යුගය සංසන්දනය කරමින් බහු ජාතික සමාගම් දිළිඳු රටවල් තුළ තම වෙළෙඳ ඒකාධිකාරය පනවන ආකාරය පෙන්නුම් කර ඇත. එයට අමතරව විරැකියාව සහ දරිද්‍රතාවය හේතු කරගෙන ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණ නිදහස් වෙළෙඳ කලාපයේ සේවය කරන තරුණ තරුණියන්ගේ දෛනික ජීවන තත්ත්වය සහ ඔවුන් මුහුණ දෙන ගැටළු සම්බන්ධව තොරතුරු හෙළි කිරීමක් සිදු කර ඇත. ඔවුන් කලාපයේ සේවය සඳහා පැමිණීමට පෙර සහ පසු යුගය පිළිබඳ විමර්ශනයක් සිදු කර ඇත.

68. මාර්ග ආයතනය. ඉඩම් සහ සේවා නියුක්තිය පිළිබඳ දේශන. කොළඹ, මාර්ග ආයතනය. 1974. කොහුවල, තිසර මුද්‍රණාලය. පිටු 122.

### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ සංවර්ධනාත්මක වැඩපිළිවෙල තුළ මූලික වශයෙන් ඉතා වැදගත් කරුණු සාකච්ඡා කළ සම්මන්ත්‍රණයකින් මෙම කෘතිය සඳහා ලිපි තෝරා ගෙන ඇත. සම්මන්ත්‍රණයෙහි ප්‍රධාන තේමාවන් වූයේ, දැනට වගා කෙරෙන කෙත්වලින් උපරිම ප්‍රයෝජනය ගැනේද?, වියලි කලාපයේ ශක්‍යතාවය තේරුම් ගෙන ප්‍රයෝජනයට ගතහොත් ලංකාව සහලින් ස්වයංපෝෂිත කළ හැකිද?, බෝග විවිධාංගීකරණය මගින් විශාල විදේශ විනිමයක් ලබා ගත හැකිද? සහ දැවෙන රැකී රක්ෂා ප්‍රශ්නයට විසඳුම් මොනවාද? යන්නයි.

කෘතිය තුළ අන්තර්ගත ලිපිවල ශීර්ෂ වන්නේ, ග්‍රාමීය අංශය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට බලන කල සේවා වියුක්ති ප්‍රශ්නය, වියලි කලාප සංවර්ධනයෙහි සේවා නියුක්ති විභවය, වියලි කලාපයේ කෘෂි කාර්මික සංවර්ධනයේ සේවා නියුක්ති (රැකී රක්ෂා) විභවය, කුඩා ඉඩම්වල කෘෂිකර්මය සඳහා පරිපාලනමය සහ සංස්ථාමය අවව්‍යුහයක්, ආදායම් ස්ථායිතාව-තත්ත්වය සහ වරප්‍රසාද, ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, කෘෂිකාර්මික පරිවර්තනය සහ රැකියා බලාපොරොත්තු, තෙත් කලාපයේ සේවා නියුක්ති විභවය සහ බෝග නානාංගකරණය සහ ඉන් ලැබිය හැකි ආදායම යන්නයි.

69. නවරත්න, පී. ශ්‍රී ලංකාවේ වැටුප් හා සේවා කොන්දේසි. කොළඹ, ෆ්‍රීඩ්රිහ්-ඒබට්-ස්ටිෆ්ටූ. 1985. කොළඹ, ලේක්හවුස් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්, පිටු 152.

### අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාව ලක්ෂ 45 ක් ලෙස අනුමාන කරනු ලබයි. එයින් රාජ්‍ය හා පළාත් පාලන සේවාවන්ට අනුබද්ධිත සේවක සංඛ්‍යාව ලක්ෂ 05ක් පමණ වේ. ඉතිරි ලක්ෂ 40 එනම් 80% ක් පමණ වැඩ කරන ජනතාවගේ වැටුප් හා සේවා කොන්දේසි විධිමත් කිරීමේ පරිපාටිය පඩි පාලක ආඥා පනත සහ සාප්පු හා කාර්යාල සේවක පනත මගින් සිදු කෙරේ. සේවකයන් විශාල සංඛ්‍යාවකට සහන සලසනු ලබන්නේ මෙම පනත් දෙකයි. එම පනත් දෙක පමණක් මෙම පොතට ඇතුළත් කර ඇත.

තව ද මෙම කෘතියට අන්තර්ගත වී ඇත්තේ ජාතික මට්ටමින් නියම කරනු ලබන අවම වැටුප් හා සේවා කොන්දේසීන් ය. පඩි පාලක සභා නවතම සංශෝධනත්, රෙගුලාසිත් පඩි පාලක සභාව මගින් නිගමනය කරන ලද අවම පඩි ප්‍රමාණයන් ඇතුළත් කර ඇත. සාප්පු හා කාර්යාල පිළිබඳ නවතම සංශෝධනත්. රෙගුලාසිත් ඇතුළත් කර ඇත. මෙයට අමතරව ව්‍යවස්ථා

ගත දීමනා පනත් තුළ අඩංගු වැදගත් කරුණු අලලා සම්පිණ්ඩනයක් ද ඉදිරිපත් කෙරේ.

70. ශ්‍රී ලංකා සේවක අධ්‍යාපනකාරකයින්ගේ සංගමය. වෘත්තීය සමිති සියවස 1893-1993 ගල්කිස්ස, ශ්‍රී ලංකා සේවක අධ්‍යාපනකාරකයින්ගේ සංගමය. 1995. කැළණිය, විද්‍යාලංකාර මුද්‍රණාලය. පිටු 125. ISBN 955-9360-00-0.

### අන්තර්ගතය

1893-1993 ශත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ඉතිහාසය, විකාශය සහ අත්දැකීම් පිළිබඳ තොරතුරු බිඳක් සැපයීම මෙහි අරමුණයි. සමස්ත වෘත්තීය සමිති ක්ෂේත්‍රය තුළ ශීඝ්‍ර වෙනස්වීම් සිදු වෙමින් පවතින අවදියක, වෘත්තීය සමිති විසින් පසුගිය ශත වර්ෂය තුළ රටේ අභිවෘද්ධිය සඳහා දායක වී ඇති අන්දම පිළිබඳ කෙටි සමාලෝචනයක් මෙම කෘතිය මගින් සිදු කරනු ලබයි.

71. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව. අද ගොවියා සතු අයිතිවාසිකම් සහ වගකීම් (1979 අංක 58 දරණ ගොවි ජන සේවා පදනම). කොළඹ, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව. පිටු 10.

### අන්තර්ගතය

අද ගොවියා යනු කවරෙක්ද?, අද ගොවියාට සලසා ඇති ආරක්ෂාව, අද ගොවියාගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද, අද ගොවීන් ඉටු කළ යුතු යුතුකම් සහ වගකීම් සහ ගොවියාට සලසා ඇති ආයතනික පහසුකම් පිළිබඳ මෙම කෘතියෙන් විස්තර කර ඇත.

## 3. ගැටුම්, ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම

### 3.1 ගැටුම් නිරාකරණය

72. ශ්‍රී ලංකා පදනම. සමාජ ගැටුම් සහ ගැටුම් නිරාකරණය. කොළඹ, මානව අයිතිවාසිකම් අධ්‍යාපන මධ්‍යස්ථානය. 1997. කොළඹ, රෆිනා ග්‍රැපික්ස්. පිටු 90. ISBN 955-9056-10-7.

**අන්තර්ගතය**

ගැටුම් නිරාකරණය යන්න මෑත කාලයේ අප රටේ ව්‍යවහාරයට පැමිණ තිබෙන සංකල්පය කි. විශේෂයෙන් ම, ජන වාර්ගික ගැටුම ආශ්‍රය කොටගෙන, ගැටුම් නිරාකරණය පිළිබඳ විවිධ ප්‍රවේශයන්, විධික්‍රමයන් හා නොයෙකුත් රටවල අත්දැකීම් අප රටේ දේශපාලන වශයෙන් ප්‍රබුද්ධ පිරිසගේ අවධානයට යොමු වී තිබේ.

ශ්‍රී ලංකා පදනමේ මානව අයිතිවාසිකම් අධ්‍යාපන මධ්‍යස්ථානය මෑත කාලයේ දී ගැටුම් නිරාකරණ පුහුණු පාඨමාලා කිහිපයක් ම සංවිධානය කර ඇත. එම පාඨමාලාවලට සහභාගි වුණු බොහෝ අය කළ ඉල්ලීමක් අනුව ගැටුම් සහ ගැටුම් නිරාකරණය විෂය සම්බන්ධව සිංහල භාෂාවෙන් මෙම පොත ප්‍රකාශයට පත් කරනු ලබයි.

ආරවුල් සහ ගැටුම් තේරුම් ගැනීම, ගැටුම් අවබෝධ කර ගැනීම, අවිහිංසාවාදීව ගැටුම් නිරාකරණය කිරීම, ගැටුම් නිරාකරණය කිරීමේ විවිධ ක්‍රම, ශ්‍රී ලංකාවේ ජන වාර්ගික ගැටුම. එහි ආරම්භය සහ විකාශනය, ජන වාර්ගික ගැටුම සමථයකට පත් කිරීම, ජාතිවාදියා මානසික රෝගියෙක් නොවේද? සහ

සාම සංස්කෘතියක් ගොඩනැගිය හැක්කේ කෙසේද? යන මාතෘකා යටතේ මෙම කෘතිය තුළින් අදහස් ඉදිරිපත් කර ඇත.

73. ගමගේ, කරුණාරත්න. ගැටුම සහ ගැටුම් නිරාකරණය. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 2006. කොළඹ, චතුර මුද්‍රණාලය, පිටු 120. ISBN 955-20-9229-9.

**අන්තර්ගතය**

නූතන සමාජය තුළ විවිධ ආකාරයේ ගැටුම් පවතී. විශේෂයෙන් 18 වැනි සහ 19 වැනි සියවස්වලින් පසුව ඇති වූ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක්

ලෙස ගොඩනැගුන සංකීර්ණ සමාජය මධ්‍යගත කරගෙන පවතින ගැටුම් විවිධාකාරයෙන් සමාජ පැවැත්මට බාධා කරන බව කිව යුතු ය. පුද්ගල මට්ටමේ සිට දේශපාලන, සමාජ ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයේ පවතින ගැටුම් සමාජ සංවර්ධනයට හිතකර නොවේ. එහෙත් මෙම ගැටුම්කාරී තත්ත්ව උපාය මාර්ගික වශයෙන් සමාජයේ ප්‍රගමනය සඳහා යොදා ගත හැකි ය. ප්‍රජා සංවර්ධනය සඳහා ගැටුම් උපාය මාර්ගික වශයෙන් යොදා ගත හැකි ආකාරය මෙම කෘතිය තුළින් පැහැදිළි කරනු ලබයි. ප්‍රධාන පරිච්ඡේද තුනක් යටතේ ගැටුම් අර්ථකථනය කිරීම, ගැටුමේ ස්වාභාවය සහ වර්ගීකරණය. ගැටුමේ කාර්යභාරය සහ ක්‍රියාවලිය සහ ගැටුම් විසඳීමේ ක්‍රියාමාර්ග ගැන කරුණු ඉදිරිපත් කර ඇත. ගැටුම සහ ගැටුමේ ස්වාභාවය පිළිබඳ සමාජ විද්‍යාඥයින්ගේ අදහස් ඉදිරිපත් කරමින් ගැටුම් නිරාකරණය කිරීමේ ප්‍රවේශයක් ඉදිරිපත් කර ඇත.

74. කරුණාදාස, ඩබ්. එම්. ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්. දෙහිවල, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ. නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්. පිටු 132. ISBN 955-9496-11-5.

අන්තර්ගතය

තරඟකාරීත්වයේ ඍණාත්මක පැත්ත විසින් අප සමාජය වෙළාගෙන ඇත. ජාතිය පිළිබඳ තීරණ ගන්නා දේශපාලඥයාගේ පටන් පාසල් අධ්‍යාපනය ලබන දූ පුතුන් දක්වා මෙම තරඟකාරීත්වයට නිර්මාණශීලී අයුරින් නොව විනාශකාරී අයුරින් දායක වී ඇත. එහි නියත ප්‍රතිඵලය වී ඇත්තේ ප්‍රචණ්ඩකාරීත්වය විසින් මුළු සමාජයම වෙළාගැනීම යි. ප්‍රචණ්ඩකාරීත්වය මව, පියා දුව, පුතා හෝ ගුරුවරයා නොහඳුනයි. සමාජ සාරධර්ම හෝ මිනිසත් බව නොතකයි. එහෙයින් ම ප්‍රචණ්ඩත්වය හිංසක හෝ අහිංසක වුව ද එය බෙහෙවින් විනාශකාරී ය. එහි ඒකායන පර්මාර්ථය ආත්මාර්ථකාමීත්වයයි. නැතහොත් ජය-පරාජය- විසඳුමයි. ජය-පරාජය විසඳුමක්, ජය-ජය විසඳුමකට පරිවර්තනය කිරීමට ශාස්ත්‍රීය විෂයක් ඇත. එය නම් ගැටුම් නිරාකරණයයි. එම විෂය පිළිබඳ දැනුමක් ලබා ගැනීම, අධ්‍යයනය කිරීම වැදගත් ය.

එහි හරය වන්නේ සිත ප්‍රධාන කොටගෙන ඇති වන්නා වූ ආකල්ප හා සිතුවිලිවලින් හටගන්නා වූ විවිධ අභිලාෂයන් ද ඉන් ජනිත වන්නා වූ ඍණාත්මක ප්‍රචණ්ඩකාරී විනාශකාරී චර්යාවන් ද වෙනස් කිරීම හා පරිවර්තනය කිරීම තුළින් නිර්මාණශීලී සමාජයක් ගොඩනැගීමයි.

මෙම කෘතිය තුළින් ගැටුම් නිරාකරණය හැඳින්වීම, න්‍යායය, සංකල්පය, මැදිහත්කරණය සහ ගැටුම් විශ්ලේෂණය යන තේමා ඔස්සේ ගැටුම සහ ගැටුම් නිරාකරණය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කර ඇත.

75. ලියනගේ, බන්දුල. ගැටුම හා ගැටුම් නිරාකරණය පිළිබඳ බෞද්ධ මතය. කතෘ. 2000. හෝමාගම, සෙනෙවිරත්න ප්‍රින්ටර්ස්. පිටු 63.
ISBN 955- 97292-1-7.

අන්තර්ගතය

අප නිරන්තරයෙන් සිතා බැලිය යුතු සලකා බැලිය යුතු ප්‍රශ්නයක් මෙහි දී සාකච්ඡා කරනු ලබයි. ගැටුම සැබවින් ම මිනිස් මනසෙහි මෙන් ම භෞතික පරිසරයෙහි නිරන්තරයෙන් උපදින, ඇතිවන සනාතන තත්ත්වයකි. ඒ පිළිබඳ බොහෝ අය පර්යේෂණ පවත්වා ඇත. අදහස් ඉදිරිපත් කර ඇත. ඇති වීමේ ක්‍රම නැති කිරීමේ මාර්ග කොතෙකුත් දේශනා කළ ද ගැටුම්ද එසේම ය. පරිණත විග්‍රහයක් නොව ගැටුම හා ගැටුම් නිරාකරණය පිළිබඳ පහසුවෙන් කළ හැකි සිතා බලන මාර්ගයකට පාඨකයා යොමු කිරීම මෙම කෘතියේ අරමුණයි. ගැටුම යනු කුමක්ද?, ගැටුම් වර්ගීකරණය, ගැටුම් නිරාකරණය ගැන බෞද්ධ මතය සහ ගැටුම් ඇති වීමට හේතු සහ ගැටුම් නිරාකරණය පිළිබඳ මෙම කෘතිය තුළින් සාකච්ඡා කර ඇත.

76. අබේවික්‍රම, ඩොරති. සේවක උපදේශන සේවය හා නිවාඩු නොගෙන වැඩට නොපැමිණීම. මහරගම, තරංජී ප්‍රින්ටර්ස්. 2000. පිටු 195.
ISBN 955-95-333-3-9.

අන්තර්ගතය

සේවකයෙකුගේ හැසිරීම් රටාවල වෙනසක් ඇති වූ විට ඔහුට හෝ ඇයට දඬුවම් කිරීම හෙවත් විනයානුකූල ලෙස කටයුතු කිරීමට පෙළඹීම ආයතන ප්‍රධානීන්ගේ ගතානුගතික සිරිතයි. එහෙත් අනපේක්ෂිත අන්දමට හැසිරෙන සේවකයෙක්/ සේවිකාවක් එසේ කරන්නේ මන්දැයි සොයා බලා ඔහුට/ ඇයට එම හැසිරීම වෙනස් කර ගැනීමට උදව් කිරීමට පාලකයින් පෙළඹෙන්නේ කලාතුරකිනි. එවැනි උදව් කරමින් සේවකයින්ගේ මෙන් ම ආයතනයේ උන්නතිය උදෙසා උපදේශනය යොදා ගැනීම සාර්ථක ව්‍යාපාර මෑතක සිට අනුගමනය කරන පිළිවෙතකි. උපදේශනය කළමනාකරුවන් විසින් හුරු පුරුදු විය යුත්තකි.

මෙම ග්‍රන්ථය උපදේශන කුසලතා ගොඩනගා ගැනීම උදෙසා ආයතන ප්‍රධානීන්ට මග පෙන්වන අත්පොතකි. උපදේශනයේ අවශ්‍යතාවය ගැන

පාඨකයාගේ අවධානය යොමු කරන කතුවරිය ඒ ගැන පූර්ණ හැඳින්වීමක් කර ඉන් අනතුරුව අප රටේ බරපතල ආයතනික ප්‍රශ්නයක් බවට පත් වී ඇති ප්‍රචාසිතාවය හෙවත් නිවාඩු නොගෙන සේවයට නොපැමිණීම ගැන විස්තරාත්මක විග්‍රහයක යෙදෙයි.

### 3.1.1 පුහුණු අත්පොත් - ගැටුම් නිරාකරණය සහ ගැටුම් වාර්තාකරණය

77. දේශපාලනික සහ ගැටුම් විපරිවර්තනය පිළිබඳ ප්‍රයත්නය (Inpact). ගැටුම් විපරිවර්තනය පිළිබඳ සම්පත් ගොනුව. කොළඹ, දේශපාලනික සහ ගැටුම් විපරිවර්තනය පිළිබඳ ප්‍රයත්නය. 2003. පිටු 206. ISBN 955-8850-00-4.

#### අන්තර්ගතය

ප්‍රචණ්ඩකාරී ගැටුම් විපරිවර්තනය පිළිබඳ පුහුණුකරුවන්, පුහුණුවන්නන් හා පහසුකාරකයින් සඳහා අත්පොතකි. ගැටුම් හා ගැටුම් විපරිවර්තනය මහද්වීපික, කලාපීය, රාජ්‍ය හෝ සංස්කෘතික කණ්ඩායම්වලට පමණක් කේන්ද්‍රීය වූවක් නොවේ. ගැටුම් පුද්ගලයන් දෙදෙනෙකු අතර මෙන් ම සමාජයේ සියළුම ස්ථරයන්හි දී හඳුනා ගත හැකි ය. එම ගැටුම් නිර්මාණශීලීව සහ සංවර්ධනාත්මකව විසඳා ගැනීමේ කාර්යට මෙම සම්පත් ගොනුව උපකාර කර ගත හැකි ය.

78. ජ. ජා. ස. ආසියා පැසිපික්. සාමය කරා මාවතේදී ජනවාර්ගික විවිධත්වය හා ගැටුම් වාර්තාකරණයට ශ්‍රී ලංකාවේ යහපත් ජනමාධ්‍ය භාවිතාව සඳහා වන සමීක්ෂණය සහ මග පෙන්වීම්. කොළඹ, ජ. ජා. ස. ආසියා පැසිපික්. 2005. පිටු 23. ISBN 955-8037-86-9.

#### අන්තර්ගතය

ගැටුම් වාර්තා කිරීමේ දී ජනමාධ්‍යවේදීන්ගේ ආකල්ප හා අත්දැකීම් සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ මගින් සොයා ගත් කරුණු අඩංගු වේ. මාධ්‍ය නිරීක්ෂණ අභ්‍යාස දෙකක ප්‍රතිඵල එයට අයත් වේ. පළමුවැන්න මාධ්‍ය විසින් ගැටුම් ආවරණය කළ අන්දමයි. දෙවැන්න සුනාමියෙන් පසු මාධ්‍ය ක්‍රියා කළ ආකාරයයි. මාධ්‍ය ක්‍රියා කලාපය පැහැදිළි ලෙස දක්වන ගැටුම් වාර්තාකරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන වාර්තා කිහිපයක් මෙයට ඇතුළත් වේ. මෙම කෘතිය පරිශීලනය තුළින් අපගේ වාර්තාකරණයේ බලපෑම පිළිබඳ සැබෑ තත්ත්වය ගැන වැදගත් පාඩම් කිහිපයක් ඉගෙනීමට ජනමාධ්‍යවේදීන්ට සහ අනෙකුත් සිවිල් ජනතාවට හැකියාවක් ලැබෙනු ඇත.

## 3.2 යුද්ධය සහ සාමය ගොඩනැගීම

79. උයන්ගොඩ, ජයදේව. ගැටුම්, ගැටුම් සමථනය, මාධ්‍යයනය සහ සාමය ගොඩනැගීම. කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය(SSA). 2003. හෝමාගම, සී/ ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 51.
ISBN 955-9102-61-3.

**අන්තර්ගතය**

ලංකාවේ ජන වාර්ගික ගැටුමට සාකච්ඡාමය විසඳුමක් ලබා ගැනීමේ අරමුණෙන් ආණ්ඩුවත්, කොටි සංවිධානයත් අතර දේශපාලන සාකච්ඡා ක්‍රියාවලියක් දැනට සිදුවෙමින් පවතී. මෙම ක්‍රියාවලිය තුන් වැනි පාර්ශ්වයක් විසින් පහසුකම් සැපයීම තුළින් ආරම්භ වූවකි. ජාත්‍යන්තර ප්‍රජාවද දැන් සාකච්ඡා ක්‍රියාවලිය හා සම්බන්ව සිටිති. ඒ අතර සාකච්ඡා ක්‍රියාවලිය හා එයින් ඇති විය හැකි ප්‍රතිඵල පිළිබඳ රටේ පවතින්නේ ඉතා තියුණු විවාදයකි.

මේ පසුබිම තුළ ගැටුම්, ගැටුම් සමථනය, සාම සාකච්ඡා හා සාමය ගොඩනැගීම පිළිබඳ අප රටේ ඇති වන සාකච්ඡාව ගැඹුරු හා පුළුල් කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතු වී තිබේ. ඒ පිළිබඳව මහජන අවබෝධය ද ඉහළ තලයකට නැංවීම, සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය ය. තියුණු දේශපාලන විඥානයක් මෙන් ම, දියුණු දේශපාලන අවබෝධයක් ද ඇති පුරවැසි පිරිසක් සිටීම රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය ගොඩනැගීමේ කර්තව්‍ය සාර්ථක කිරීමේ කේන්ද්‍රීය සහතිකයක් වන බව අපේ විශ්වාසයයි.

මෙම ප්‍රකාශන මාලාව, සාධනීය හා කල්පවත්නා සාමයක් සඳහා අප රටේ දැනට සිදුවන පරිවර්තනයට සෘජුව දායක වීමට අපේක්ෂා කරන පුරවැසියන්ගේ ප්‍රජා අධ්‍යාපනයට සෘජු දායකත්වයක් සපයනු ඇත.

පවත්නා සිවිල් යුදමය පසුබිම තුළ ගැටුම්, ගැටුම් සමථනය, සාම සාකච්ඡා හා සාමය ගොඩනැගීම පිළිබඳව මහජන අවබෝධය ඉහළ තලයට නැංවීම මෙම කෘතියේ අරමුණයි.

80. ෆර්ක්ස්, ජෝර්ජ් සහ ක්ලෙම්, බාර්ට්. විවිධත්වයට ආමන්ත්‍රණයඃ ගැටුම හා සාමය පිළිබඳ ශ්‍රී ලාංකීය කථිකා. හේග්, ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ නෙදර්ලන්ත ආයතනය (Clingendal). 2005. මහරගම, තරංජී ප්‍රින්ට්ස්. පිටු 299. ISBN 90-5031-094-x.

**අන්තර්ගතය**

ශ්‍රී ලංකාවේ සාමය සහ ගැටුමට අදාළ විවිධ අදහස් හා සොයා ගැනීම් බෙදා හැරීම මෙම කෘතියේ අරමුණයි. මෙම විෂය පිළිබඳ පුළුල් පරාසයක පැතිරෙන අදහස් මාලාවක් පැවතිය ද ඒවා බෙදා ගැනීමක් හෝ සාකච්ඡාවට ලක් වීමක් බොහෝ විට සිදු නොවේ. සම්මන්ත්‍රණ සහ වැඩමුළු ශ්‍රී ලංකාවේ සුලබ සංසිද්ධියක් වුවත් ඒවා මගින් රටේ විවිධ පළාත්වල පවතින පුළුල් කථිකා එක්තැන් වීමක් සිදු නොවේ. විශේෂයෙන් ම නැගෙනහිර, දකුණේ සහ උතුරේ විද්වතුන් අතර අදහස් හුවමාරුවක් ප්‍රමාණවත් ලෙස සිදුවන්නේ නැත. මෙම කෘතිය නැගෙනහිර විශ්ව විද්‍යාලය, යාපනය විශ්ව විද්‍යාලය, රුහුණු විශ්ව විද්‍යාලය සහ අග්නිදිග විශ්ව විද්‍යාලය යන ආයතනවලට අනුයුක්ත වියතුන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයකි. ඔවුන් විසින් තොරතුරු එකතු කොට තෝරාගත් අධ්‍යයන ඇසුරින් ලිපි සම්පාදනය කර ඇත. පොතේ මූලික කොටස ශ්‍රී ලංකාවේ සාමය හා ගැටුම ගැන පවතින විවිධ පර්යාලෝකයන් ගැන සංක්ෂිප්තයක් දක්වන අතර ඒවා තේමා කිහිපයක් යටතේ වර්ගීකරණය කර ඇත. දකුණේ පර්යාලෝකය, නැගෙනහිර දමිළ පර්යාලෝකය, නැගෙනහිර මුස්ලිම් පර්යාලෝකය හා උතුරේ පර්යාලෝකය වශයෙන් පොතේ ඉතිරිය කොටස් හතරකට බෙදා කරුණු දක්වා ඇත.

81. සාම සහයෝගිතා කණ්ඩායම. සාමය සඳහා න්‍යාය පත්‍රයක්. කොළඹ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA). කොළඹ, ග්ලොබ් ප්‍රින්ටින් වර්ක්ස්. පිටු 16.

**අන්තර්ගතය**

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පවතින වත්මන් ගැටුමට යුදමය විසඳුමක් නැත. දෙපාර්ශවය විසින් ම කරගෙන යන අවසානයක් නැති යුධමය මෙහෙයුම් මගින් කවර පාර්ශ්වයකට හෝ තීරණාත්මක ජයග්‍රහණයක් ලබා දීමට අසමත් වී ඇත. පෙනෙන්නට තිබෙන යථාර්ථය එයයි. මානව ඛේදවාචකයක් පමණක් එම යුද්ධයෙන් ඇති කර ඇත. පිට පිටම කරගෙන යන යුධ මෙහෙයුම් නිසා සිවිල් ජනයා මත ඉසිලිය නොහැකි විපාක ඇති කරනු ලබයි.

මෙම කෘතිය, වත්මන් ගැටුමට කිසිදු යුදමය විසඳුමක් නැති බව ඕනෑම සාම න්‍යාය පත්‍රයක ආරම්භක ස්ථානයේ තිබිය යුතු බවට අවධාරණය කර සියළුම දේශපාලන පක්ෂ වෙත කරන ලද විවෘත සංදේශයකි.

82. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA). වාර්ගික අර්බුදය සහ සිවිල් සමාජයෙහි වගකීම (1999 ජනවාරි 30 කොළඹ මහජන පුස්තකාලයේ දී පවත්වන ලද සම්මන්ත්‍රණයේ දේශන ඇසුරෙනි.) කොළඹ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. 2000. පිටු 32. ISBN 955-8037-12-5.

අන්තර්ගතය

ශ්‍රී ලංකාවේ පවතින ජනවාර්ගික අර්බුදය අනාගත සංවර්ධනය සහ සෞභාග්‍ය කෙරෙහි දීර්ඝ කාලීන පලවිපාක ඇති කරමින් දිග්ගැස්සෙන අවි ගැටුමක් බවට පත් වී ඇත. යුද්ධය හේතුවෙන් වැය වුණු හා විනාශ වී ගිය විශාල ආර්ථික සම්පත්වලට අමතරව අලාභය මැනිය නොහැකි ජීවිත හානි, ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ වූ ජන වර්ග බේද වීම තව තවත් උග්‍ර වීම ද සිදුවෙමින් පවතී. මෙවැනි හේතු නිසා ජාතික න්‍යාය පත්‍රය තුළ සාමය පිළිබඳ හදිසි ප්‍රමුඛතාවයක් දිය යුතු බව පැහැදිලි කිරීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය. සම්මන්ත්‍රණයේ දේශන පැවැත්වීම, ආර්ථික කඩා වැටීමක් තුළින් සාමයක් පැවතිය හැකිද? -පැට්‍රික් අමරසිංහ, සියළු ජන කොටස්වලට පිළිගත හැකි එකඟත්වයක් - මහින්ද සමරසිංහ සහ අවිචාරවත් දේශපාලන සංස්කෘතියක් යන තේමාව ඔස්සේ වික්ටර් අයිවන් යන මහත්වරුන් විසින් සිදුකර ඇත.

83. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය(CPA). සාම ක්‍රියාවලිය සහ සුළු ජාතික පක්ෂවල වගකීම (1999 මාර්තු 06 දෙහිවල ජයසිංහ ශාලාවේ පවත්වන ලද දේශන ඇසුරෙනි). කොළඹ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. 1999. කොළඹ, ග්ලොබ් ප්‍රින්ටර්ස්. ISBN 955-8037-14-1.

අන්තර්ගතය

අප රටේ පවතින ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සාමකාමී ලෙස ලබා ගත යුතු ය. කලින් කලට සාම සාකච්ඡා පසුබෑමට ලක් වූ අවස්ථා තිබුණ ද අවසාන වශයෙන් විසඳුමක් ලබා ගත හැක්කේ ද සාකච්ඡා මාර්ගයෙන් ය යන විශ්වාසය ඇතිව අප ක්‍රියාත්මක වෙමින් සිටිමු. මේ සම්බන්ධව ශ්‍රී ලංකාවේ සුළු ජාතීන් නියෝජනය කරන පක්ෂවල නියෝජිතයන්ගේ අදහස් උදහස් මෙම කෘතියට ඇතුළත් වී ඇත.

84. ෆොන්සේකා, කාලෝ. සාමයෙන් යුතු ශ්‍රී ලංකාවක් සඳහා කොළඹ, සමාජ විද්‍යාඥයින්ග් සංගමය(SSA). 1998. කොළඹ, සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ. පිටු 243. ISBN 955-9102-15-x.

## අන්තර්ගතය

බොහොමයක් සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රශ්නවලට සදාතනික අවසාන විසඳුම් නැත. අපට ප්‍රායෝගිකව කළ හැක්කේ මිනිසුන් විඳින දුක හැකි තාක් අඩු කිරීමට ප්‍රයත්න දැරීමයි. එම අරමුණ කරා පියමන් කිරීමට උපයෝගී කර ගත හැකි එක් මාර්ගයක සෛද්ධාන්තික පදනම මෙම කෘතියෙන් අනාවරණය කර ඇත.

මෙම පොත විශ්ව විද්‍යාල සිසුන් සඳහා වන ප්‍රාරම්භක පාඩම් හයකින් සමන්විත පාඨමාලාවක විෂය කරුණු ලෙස බෙදනු ලැබ ඇත. පාඩම් හයක පාඨමාලාවක් ලෙස සැළසුම් කොට ඇත්තේ එය සහේතුක අනුපිළිවෙලක් අනුව ක්‍රමයෙන් විකසිත වන පරිද්දෙන් වුව ද එක් එක් පාඩම අංග සම්පූර්ණ ඒකකයක් ලෙස සකස් කරනු ලැබ ඇත.

අපේ ගැටළුව, යන මැයෙන් යුත් පළමු වන පාඩම නූතන ලෝකයේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාව මුහුණපා ඇති සමාජ, ආර්ථික, දේශපාලන, ආගමික, ජනවාර්ගික හා පාරිසරික යනා දී පැති ගණනාවකින් යුත් ගැටළුවේ ස්වරූපය හඳුන්වා දීමට වෑයම් කරයි.

ශ්‍රී ලංකාව ප්‍රරෝහණ ශක්තිය සහිත, සාමයෙන් යුතු රාජ්‍යයක් ලෙස නොනැසී පැවතීමට නම් මේ ගැටළු විසඳිය යුතු ය. එම විසඳුම දැනුම මත පදනම් විය යුතු ය. එහෙත් දැනුම යනු කුමක්ද? දෙවැනි පාඩම මෙම ප්‍රශ්නය විග්‍රහ කරයි.

මිනිස් දනුම මිනිස් සුබ සිද්ධිය සඳහා මෙහෙ කළ යුතු යැයි පිළිගනු ලබන්නේ නම්, මිනිස් සුබ සිද්ධිය යනු කුමක්දැයි තීරණය කිරීම අවශ්‍ය වෙයි. මේ සඳහා මනුෂ්‍ය ස්වභාවයේ ඇති සැටිය පිරික්සා බැලීම අවශ්‍ය වෙයි. තුන් වැනි පාඩමෙන් එබඳු ගවේෂණයක් කිරීමට යත්න දරනු ලබයි. සතර වෙනි පාඩම තුළින් වෑයම් කරනු ලබන්නේ මනුෂ්‍ය ස්වභාවය සහ මනුෂ්‍ය අවශ්‍යතා පිළිබඳ වන විශ්ලේෂණයක් මගින් මූලික මිනිස් අයිතිවාසිකම් ගැන සංකල්ප කුලකයක් උපයා ගැනීමටයි. පස් වැනි පාඩමෙන් වෑයම් දරන්නේ ශ්‍රී ලංකාවේ දර්ශන කෝණය අනුව අපේ ලෝකයේ තත්ත්වය පිළිබඳ පුළුල් සමීක්ෂණයක් කිරීමටයි.

මෙම මුල් පාඩම් මගින් දමනු ලබන සංකල්පමය අත්තිවාරම් පදනම් කොට ගෙන, අපේක්ෂිත අනාගතය සඳහා නියාමක උපදෙස් පෙළක් හෙවත් මග පෙන්වීමක් සැපයීම සඳහා වර්තමානය අවබෝධ කර ගැනීමේ අරමුණ සහිතව, ශ්‍රී ලංකාවේ අතීතය පිළිබඳ සමාලෝචනයක් අවසාන පාඩමෙන් සිදු කරයි.

## 3.3 තරුණ ගැටුම්

### 3.3.1 සමාජ/දේශපාලන කැරළි

85. අයිවන්, වික්ටර්. ශ්‍රී ලංකාවේ නූතන කැරළිකරුවන්ගේ සමාජ පසුබිම. රත්මලාන, සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශන සේවාව. 1990. රත්මලාන, සර්වෝදය විශ්ව ලේඛා. පිටු 225. ISBN 955-599-019-0.

**අන්තර්ගතය**

ශ්‍රී ලංකාවේ තරුණ පරපුර අවස්ථා දෙකක දී ම ඉතාමත් ප්‍රචණ්ඩකාරී බලවේගයක් ලෙස ක්‍රියා කළේ ඇයි? කැරැල්ලෙන් තමන්ට ලැබෙන ප්‍රතිඵලය මරණය බව දැන දැන ම ඔවුන් එවැනි බිහිසුණු මාර්ගයක් වෙත යොමු වූයේ ඇයි? ඒ කෙරෙහි බලපා ඇති සමාජ ආර්ථික හා දේශපාලන හේතු සාධක මොනවාද? යන්න පිළිබඳ විග්‍රහ කිරීම මෙම කෘතිය තුළින් සිදු වේ.

86. අයිවන්, වික්ටර්. අර්බුදයේ ගමන් මග (ඓතිහාසික විකාශනයේ ඇතැම් ලක්ෂණ) ගල්කිස්ස, රාවය. 1989. රත්මලාන, සර්වෝදය විශ්ව ලේඛා. පිටු 97.

**අන්තර්ගතය**

ඉතිහාසය තුළ අතීතය පමණක් නොව අනාගතය ද අඩංගු වී පවතී. එය අතීතයේ දී සිදුවූ දේවල් කීමෙන් නොනැවතී අනාගතයේ දී සිදු විය හැකි දේ ද කියනු ලබයි. 1971 දී ඇති වූ තරුණ කැරැල්ල ද ලංකාවේ අනාගතය අරභයා ඉතිහාසය විසින් දෙනු ලැබූ සංඥාවකට සමාන ය. එහෙත් එය විසින් දෙන ලද සංඥාව නිවැරදි ලෙස තේරුම් ගෙන ඊට අනුකූලව ක්‍රියා කිරීමට සමාජයට හැකි වී නැත. අද රටේ පවතින අර්බුදකාරී තත්ත්වය ද එහි ම නොවැළක්විය හැකි ප්‍රතිඵලයක් වන්නේ ය. ඒ මගින් ඉතිහාසය දෙස නැවත වරක් වඩාත් ප්‍රබල ආකාරයකින් එම සංඥාව සමාජය වෙත ඉදිරිපත් කර සිටියි.

ආචීර්ණ කල්පික යුගය (1948-56), ප්‍රතිසංස්කරණ යුගය (1956-71), විප්ලවීය යුගය (1971-77), ප්‍රතිගමන යුගය (1977-88) සහ නිදහස් යුගය ලෙස ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු මේ දක්වා කාල පරාසයන් යටතේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන කාරණා යටතේ මෙම කෘතිය තුළින් සාකච්ඡා කර ඇත.

දළ ජාතික නිෂ්පාදනයේ ආංශික සැකැස්ම (1953-1987), රජයේ අය වැය අතිරික්තය (1948- 1986), රාජ්‍ය ණය සංයුතිය (1949-1987), අපනයන පරිමාව

(1938-1987), අපනයන මිල (1938-1987), ආනයන පරිමාව (1938-1987), ආනයන මිල (1938-1987), වෙළෙඳ ශේෂය (1948-1985), ශ්‍රම බලකායඃ සේවා වියුක්තිය හා සේවා නියුක්තිය (1946-1985) සහ ආර්ථිකයේ අංශ අනුව සේවා නියුක්ති ජනගහනය (1948-1981) සංඛ්‍යා සටහන් මෙම කෘතියට ඇතුළත් වේ.

87. අයිවන්, වික්ටර්. 71 අප්‍රේල් කැරැල්ල. කොළඹ, සී/ස ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, 1979. පිටු 189.

**අන්තර්ගතය**

1971 අප්‍රේල් කැරැල්ල ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික හා දේශපාලන ජීවිතය සසල කිරීමටත් ප්‍රශ්න කිරීමටත් තුඩු දුන් ඓතිහාසික සංසිද්ධියකි. කැරැල්ලත් එහි පසුබිම සහ එහි ප්‍රතිඵල පිළිබඳවත් මෙම පොත තුළින් විග්‍රහ කර ඇත.

මෙම කෘතියේ කතුවරයා 1971 කැරැල්ල සමග සම්බන්ධව සිට සිරභාරයට පත් වීමෙන් පසු නිදහස ලබා ඇත. සිරගතව සිටි කාලයේ දී මෙම කෘතිය රචනා කර ඇත. දැනට ජීවතුන් අතර නොමැති 71 කැරැල්ල හා කෙළින්ම සම්බන්ධව සිටි ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ගෙන් ලබා ගත් තොරතුරු ද මෙම කෘතියට ඇතුළත් ය.

88. ආරියසේන, සම්පත්. 80 දශකයෙහි සිංහල තරුණ කැරැල්ලේ ප්‍රචණ්ඩ පසුබිම. රත්මලාන, නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන පදනම. 2000. පිටු 112. ISBN 955-8210-03-x.

**අන්තර්ගතය**

මෙම කෘතිය ශ්‍රී ලංකාවේ දේශපාලනය හා ආණ්ඩු, ප්‍රචණ්ඩත්වය සහ දකුණේ සිංහල තරුණ කැරැල්ල පිළිබඳව සමාජ. ආර්ථික සහ දේශපාලනමය විග්‍රහයකි.

89. මුණසිංහ, රෝහිත. එළියකන්ද වධ කඳවුර. නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ. 2005. පොල්ගස්ඕවිට, සිකුරු ප්‍රකාශකයෝ. පිටු 210. ISBN 955-573-379-1.

**අන්තර්ගතය**

මෙම ග්‍රන්ථයේ කතුවරයා, 1989 භීෂණ සමයේ දී යුද හමුදාව විසින් අත් අඩංගුවට ගෙන වැලිගම හමුදා කඳවුර, මාතර එළියකන්ද වධකාගාරය, බූස්ස රැඳවුම් කඳවුර, කොග්ගල පුනරුත්ථාපන කඳවුර යන ස්ථානවල වසරක් පමණ කොටු වී සිට, 1991 දී ප්‍රංශයට පැමිණ ප්‍රංශ රජයෙන් දේශපාලන රැකවරණ ලබා ගත් අයෙකි.

භීෂණ යුගය ලෙස නම් දැරූ අඳුරු කාල පරිච්ඡේදයේ දී හමුදා කඳවුරුවල සහ වධකාගාර තුළ දී සිදු වු සියළු ආකාරයේ ම්ලේච්ඡ ක්‍රියා, ඝාතන ගැන සහ අමානුෂික අප්‍රකට සිදුවීම් පිළිබඳ අන්තවාදී නොවු දෘෂ්ඨියකින් කරන මධ්‍යස්ථ විග්‍රහයක් මෙම කෘතියට ඇතුළත් ය.

### 3.3.2 මත්ද්‍රව්‍ය භාවිතය සහ වැළැක්වීම

90. පීරිස්, මන්ජරී. ජනමාධ්‍ය තුළින් සිදුකරන මධ්‍යසාර හා දුම්වැටි ප්‍රචාරණය සහ ළමා පරපුර. කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශය. 2003. නුගේගොඩ, සී/ස දීපානි මුද්‍රණ. පිටු 94. ISBN 955-9093-12-6.

#### අන්තර්ගතය

මත්ද්‍රව්‍ය හේතු කරගෙන වර්ෂයක් තුළ මිනිස් ජීවිත සෑහෙන ප්‍රමාණයක් අභාවයට යයි. තවත් පිරිසක් රෝග පීඩාවලට ගොදුරු වේ. පවුල් විශාල ගණනක් බේද වනු ලබයි. මෙම හේතු නිසා ප්‍රධාන වශයෙන් ම දරුවන්ගේ සහ ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් අහිමි වී යයි. එයට අමතරව

ලාබාල වයසේ පසුවන දරුවන් සහ තරුණයින් මත්ද්‍රව්‍ය සඳහා ග්‍රහණය කර ගැනීම පිණිස ප්‍රබල වෙළෙඳ ප්‍රචාරයක් ගෙන යනු ලබයි. සමාජ තත්ත්වය එයයි. මේ පිළිබඳ විග්‍රහයක් සහ ළමා/ තරුණ පරපුර මත්ද්‍රව්‍ය උවදුරෙන් මුදවා ගැනීම සඳහා උපදෙස් සහ තොරතුරු මෙම ග්‍රන්ථයට ඇතුළත් වේ.

91. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය. මත්ද්‍රව්‍ය නිවාරණ අත්පොත. කොළඹ, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය- නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය. කොළඹ, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව. පිටු 59. ISBN 955-9137-19-0.

#### අන්තර්ගතය

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පුහුණුකරුවන් සඳහා භාවිත කළ හැකි අත්පොතකි. මෙම පුහුණු අත්පොත තුළ විධිමත් සහ අවිධිමත් ආකාරයේ මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලට භාවිතා කළ හැකි ක්‍රමවේද අඩංගු වේ.

92. චන්ද්‍ර බණ්ඩාර, එම්. එම්. එස්.. සමාජය, පෞරුෂය සහ මත්ද්‍රව්‍ය භාවිතය (මත්ද්‍රව්‍ය භාවිතයේ මනෝ සමාජයීය ලක්ෂණ සහ විසඳුම් මාර්ග). කතෘ. 2004. නුගේගොඩ, කොලිටි ප්‍රින්ටර්ස්. පිටු 60.
ISBN 955-98847-0-0.

අන්තර්ගතය

මත්පැන්, මත්ද්‍රව්‍ය ආදියට ඇබ්බැහි වුණු පුද්ගලයන්ට ඒවායින් ඉවත් වීමට ආධාර, උපකාර කරන මග පෙන්වීම් කරන සහ එසේ කිරීමට බලාපොරොත්තු වන සමාජයේ ඕනෑම මට්ටමක සාමාජිකයෙකුට සිය කටයුතු වඩාත් විද්‍යානුකූල ලෙස සංවර්ධනය කර ගැනීමට මෙම ග්‍රන්ථයේ අදහස් ප්‍රයෝජනවත් වනු ඇත.

93. රස්නැක්, බෙන්. සුදු දෙවඟන. රත්මලාන, ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය. 1992. නුගේගොඩ, සී/ස දීපානි (පෞද්ගලික) සමාගම. පිටු 145. ISBN 955-999-042-5.

අන්තර්ගතය

"සුදු" එල් එස් ඩී මත් කුඩු විශේෂයකි. එම මත්ද්‍රව්‍ය අපේ රට ක්‍රමයෙන් වසඟයට ගෙන ඇති අතර ඒ නිසා ව්‍යසනයට පත් වුවන්ගේ ගණන පනස් දහස ඉක්මවයි. ඔවුන්ගෙන් 90%ක් පමණ ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ අය බව සඳහන් වේ. මෙතරම් විශාල ප්‍රමාණයක් මෙම ව්‍යසනයට ගොදුරු වී ඇත්තේ ඇයි? මුදල් හා බලය ආදේශ කළ කාලකණ්නිකම නිසාද? නැතහොත් ශාරීරික, මානසික සහ ආර්ථික වශයෙන් ඔවුන් රෝගීව සිටින නිසාද? නොඑසේ නම්, කූට ජාවාරම්කරුවන්ගේ තාඩන පීඩන, බලපෑම්වලට නතු වී ඇති හෙයින්ද? හේතුව කුමක් වුවත් ව්‍යසනයට ගොදුරු වී ඇත්තේ තරුණ පිරිස් නිසා තත්ත්වය උග්‍ර වීමට පෙර ඔවුන්ව බේරා ගත යුතුව ඇත. මෙම කෘතිය ඉදිරිපත් කරනුයේ මෙම ප්‍රශ්නය පිළිබඳව සෑම දෙනාගේ ම විශේෂයෙන් ම තරුණ පරපුරේ අවධානය යොමු කිරීම සඳහා ය. මෙහි දී කතුවරයා සාම්ප්‍රදායික බණ කීමෙන් වැළකෙයි. අවවාද දෙන්නේ නැත. මත්ද්‍රව්‍ය භාවිතය රෝගයක් ලෙස සලකා ඔහු ඒ සඳහා කළ හැකි ප්‍රතිකාර පිළිබඳ අපේ මනස යොමු කරනු ලබයි.

cepa
centre for poverty analysis
29, Gregory's Road, Colombo 7, Sri Lanka
T. +94 (011) 2676 955-8, 2667 967-8
F. +94 (011) 2676 959
E. info@cepa.lk
www.cepa.lk

ISBN 978-955-1040-43-7
මුද්‍රණය සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ